# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ

**අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම සහ ඒ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමට සහ ඔවුන් ආරක්ෂා කිරීමට අදාළ සුදුසු ජාත්‍යන්තර ප්‍රතිමාන, ප්‍රමිති සහ යහපත් පරිචයන් බලාත්මක කිරීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය පිහිටුවීම, අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම සහ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදල පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අපරාධයක වින්දිතයන්ට වන්දි ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පරිච්ඡින්න කිරීම පිණිස ද; සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2023 අප්‍රේල් මස 25 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 මාර්තු මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[173 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 170.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ

එල්.ඩී.–ඕ. 38/2019

**අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම සහ ඒ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමට සහ ඔවුන් ආරක්ෂා කිරීමට අදාළ සුදුසු ජාත්‍යන්තර ප්‍රතිමාන, ප්‍රමිති සහ යහපත් පරිචයන් බලාත්මක කිරීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය පිහිටුවීම, අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම සහ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදල පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අපරාධයක වින්දිතයන්ට වන්දි ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පරිච්ඡින්න කිරීම පිණිස ද; සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2023 අංක  දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර මේ පනතේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන කථානායකවරයාගේ සහතිකය පනත් කෙටුම්පතෙහි සටහන් කරනු ලබන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### පනතේ අරමුණු

**2.** මේ පනතේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු යː- පනතේ අරමුණු

(අ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම;

(ආ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් තහවුරු කිරීමේ දී, ප්‍රවර්ධනය කිරීමේ දී සහ ආරක්ෂා කිරීමේ දී රජයේ, අධිකරණ නිලධරයන්ගේ සහ රජයේ නිලධරයන්ගේ කාර්ය සහ වගකීම් දැක්වීම;

(ඇ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහි වරදවල් සංස්ථාපනය කරන්නා වූ ක්‍රියා සඳහන් කිරීම;

(ඈ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව ලබා දීම;

(ඉ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ක්‍රියාත්මක කිරීමට සහ බලාත්මක කිරීමට ද සහන ලබා ගැනීමට ද හැකියාව ලබා දෙන යාන්ත්‍රණයක් සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට වන්දි, ප්‍රතිෂ්ඨාපනය, හානිපූරණය සහ පුනරුත්ථාපනය ඇතුළුව සහන ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(උ) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියක් ද අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයක් ද පිහිටුවීම;

(ඌ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම මගින් අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සාක්ෂි දීම සඳහා විධිවිධාන සැලසීම; සහ

(එ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය දීමට සහ ඔවුන් ආරක්ෂා කිරීමට අදාළව ජාත්‍යන්තරව පිළිගත් යහපත් පරිචයන් පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

## II වන කොටස

## අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම්

සාධාරණ සැලකීමක් සඳහා අපරාධයක වින්දිතයකුට ඇති අයිතිවාසිකම

**3.** (1) අපරාධයක වින්දිතයකුට-

(අ) සමානව සහ සාධාරණව ද ඒ අපරාධයක වින්දිතයාගේ අභිමානයට සහ පෞද්ගලිකත්වයට ගෞරවනීය වන ලෙස ද සැලකීමක් ලැබීමට;

(ආ) අපරාධයක වින්දිතයකු වශයෙන් අත්විඳි යම් හිංසාවකට, අලාභයකට හෝ පාඩුවකට සරිලන පරිදි, හානිපූරණය සහ ප්‍රතිෂ්ඨාපනය ද ඇතුළුව ප්‍රමාණවත් සහ සාධාරණ සහනයක් අප්‍රමාදව ලබා ගැනීමට;

(ඇ) තර්ජන, බියගැන්වීම්, පළිගැනීම් හෝ ප්‍රතිප්‍රහාරයන් ඇතුළුව යම් හිංසාවකින් හෝ සිදුවිය හැකි හිංසාවකින් ආරක්ෂා වීමට;

(ඈ) අපරාධයක වින්දිතයකු වශයෙන් අත්විඳින දුබලතාවක් හෝ ආබාධයක් ඇතුළුව යම් කායිකමය, චෛතසිකමය, චිත්තවේගීමය හෝ මානසික හානි සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට;

(ඉ) ඒ අපරාධයක වින්දිතයා ළමයකු වන අවස්ථාවක දී, ඒ ළමයාගේ උපරිම යහපත තහවුරු වන ආකාරයේ සැලකීමක් ලැබීමට;

(ඊ) ඒ අපරාධයක වින්දිතයා වෛද්‍ය පරීක්ෂණයකට ලක් කරනු ලැබිය යුතු කාන්තාවක් වන අවස්ථාවක දී, කාන්තා වෛද්‍ය වෘත්තිකයකු මගින් එසේ පරීක්ෂණයකට ලක් කරවා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට; සහ

(උ) අදාළ වරද ලිංගිකමය ස්වභාවයේ වරදක් වන අවස්ථාවක දී, වරද පිළිබඳ විමර්ශනය හෝ පරීක්ෂණය සිදු කළ යුතු නිලධරයාගේ ස්ත්‍රී පුරුෂභාවය නිශ්චිතව සඳහන් කිරීමට,

අයිතිවාසිකම තිබිය යුතු ය.

(2) අපරාධයක වින්දිතයකු විසින්, (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය හෝ (උ) ඡේදය යටතේ වූ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, කාන්තා වෛද්‍ය වෘත්තිකයකු මගින් පරීක්ෂණයකට ලක් කරවා ගැනීමට ඉල්ලීමක් කරන හෝ වරද පිළිබඳ විමර්ශනය හෝ පරීක්ෂණය සිදු කළ යුතු නිලධරයාගේ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව නිශ්චිතව සඳහන් කරන කවර හෝ අවස්ථාවක දී, ඒ අපරාධයේ වින්දිතයා විසින් ඉල්ලා සිටින ලද හෝ නිශ්චිතව සඳහන් කරන ලද ස්ත්‍රී පුරුෂභාවයේ, අවස්ථාවෝචිත පරිදි වෛද්‍ය වෘත්තිකයකු හෝ විමර්ශන හෝ පරීක්ෂණ නිලධරයකු විසින් ඒ වෛද්‍ය පරීක්ෂණය හෝ විමර්ශනය හෝ පරීක්ෂණය සිදු කරනු ලබන බවට සහතික කිරීම සඳහා සියලු ප්‍රයත්නයන් දැරීම රජයේ කාර්යය විය යුතු ය.

අපරාධයක වින්දිතයකුට ලබාගත හැකි සහාය, ආරක්ෂාව සහ ප්‍රතිකර්ම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඔහුට ඇති අයිතිවාසිකම

**4.** යම් අපරාධයක වින්දිතයකු විසින් ඉල්ලීමක් කිරීමේ දී-

(අ) (i) මේ පනත යටතේ ඒ අපරාධයක වින්දිතයාට ලබා ගත හැකි ආරක්ෂක පියවර පිළිබඳව;

(ii) ඒ අපරාධයක වින්දිතයා අත්විඳ ඇති යම් හිංසාවක් සඳහා සහන සලස්වා ගැනීමට පවතින දිලික්තමය ප්‍රතිකර්ම ඇතුළු නෛතික ප්‍රතිකර්ම පිළිබඳව; සහ

(iii) නෛතික සහන ලබාගැනීම සඳහා නඩු කටයුතු පවරනු ලැබිය යුතු කාලසීමා පිළිබඳව,

අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය හෝ යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් මගින් දැනුම්වත් වීම සඳහා; සහ

(ආ) ඒ අපරාධයක වින්දිතයාට සිදු වී ඇති යම් හානියක් සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ඇති වෛද්‍ය සේවා,

සමාජ සේවා සහ වෙනත් සහාය පිළිබඳව සහ ඒ අපරාධයක වින්දිතයාට සහාය වීම සඳහා ඇති යම් පහසුකම් පිළිබඳව අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය මගින් දැනුම්වත් වීම සඳහා,

අයිතිවාසිකම ඒ අපරාධයක වින්දිතයාට තිබිය යුතු ය.

පැමිණිලි, පරීක්ෂණ, විමර්ශන ආදිය සම්බන්ධයෙන් අපරාධයක වින්දිතයකුට ඇති අයිතිවාසිකම

**5.** (1) අපරාධයක වින්දිතයකුට-

(අ) මේ පනත යටතේ වරදක් සංස්ථාපනය කරන්නා වූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට, පැමිණිල්ලක් කිරීමට හෝ පැමිණිල්ලක් කරනු ලැබීම සඳහා කටයුතු සැලැස්වීමට සහ ඒ පැමිණිල්ල වාර්තාගත කරවා ගැනීමට සහ නීතියට අනුව විමර්ශනය කරවා ගැනීමට;

(ආ) සිදු කරගෙන යනු ලබන යම් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට අගතියක් නොවන පරිදි තමා විසින් ම හෝ නීතිඥවරයකු මගින්, විමර්ශන අධිකාරිය හෝ පරීක්ෂණ අධිකාරිය වෙත නියෝජනයන් සිදු කිරීමට සහ සාධාරණ කාලසීමාවක් ඇතුළත ප්‍රතිචාරයක් ලබා ගැනීමට;

(ඇ) පැමිණිල්ලට අගතියක් නොවන පරිදි සහ මේ පනතේ විධිවිධානවලට අනුකූලව, අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි ඇති යම් නඩු කටයුතුවල ඕනෑම අවස්ථාවක දී නීතිඥවරයකු මගින් පෙනී සිටීමට;

(ඈ) අවශ්‍ය වන්නේ නම්, රජයෙන් නීති ආධාර ලබා දෙන ලෙසට ඉල්ලීමක් කිරීමට;

(ඉ) වරද සිදු කරනු ලැබූ තැනැත්තා වරදකරු කිරීමෙන් පසුව සහ දඬුවම තීරණය කිරීමට පෙරාතුව, 8 වන වගන්තියට අනුකූලව වින්දිත බලපෑමේ ප්‍රකාශයක් පෞද්ගලිකව හෝ නීතිඥවරයකු මගින් අධිකරණයට හෝ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට;

(ඊ) වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට සමාවක් ප්‍රදානය කිරීම හෝ ඒ තැනැත්තාට පනවන ලද දඬුවමක් ලිහිල් කිරීම පිළිබඳව යම් බලයලත් තැනැත්තකු විසින් සලකා බලන අවස්ථාවක දී, ඒ පිළිබඳ දැන්වීමක් ලැබීමට සහ සිදු කරන ලද ඒ වරද ඒ අපරාධයක වින්දිතයාට ශාරීරිකව, චිත්තවේගීමය ලෙස, මානසිකව, මූල්‍යමය ලෙස, වෘත්තීමය ලෙස හෝ වෙනත් යම් අයුරකින් බලපා ඇති ආකාරය පිළිබඳව එසේ සමාව ප්‍රදානය කරන හෝ දඬුවම ලිහිල් කරන තැනැත්තා වෙත අධිකාරිය මගින් කරුණු ගෙන හැර දැක්වීමට;

(උ) විමර්ශනයේ, පරීක්ෂණයේ හෝ නඩු කටයුත්තේ යම් අවස්ථාවක දී, අදාළ වරද තමාට බලපා ඇති ආකාරය පිළිබඳව නීතීඥවරයකු මගින් හෝ ඒ අපරාධයේ වින්දිතයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ලිඛිතව හෝ නීතිපතිවරයා වෙත නියෝජනයන් සිදු කිරීමට;

(ඌ) සිදු කර ඇතැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි ඇති යම් නඩු කටයුතුවලට පැමිණීමට සහ සහභාගී වීමට පහසුකම් සලසනු ලබන යම් අදාළ තොරතුරු සහ සහාය අධිකාරියෙන් ලබාගැනීමට; සහ

(එ) යම් සිවිල් හෝ අපරාධමය, අධිකරණමය හෝ අර්ධ අධිකරණමය නඩු කටයුත්තක දී, අපරාධයක වින්දිතයකු විසින් වෙනත් සාක්ෂිවලට කන්දීම ඒ අපරාධයක වින්දිතයාගේ ඉදිරි සාක්ෂිවලට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බවට හෝ ඒ නඩු කටයුතුවල ඇතැම් කොටස් විභාගයට ගනු ලබන කාලය තුළ දී ඒ අපරාධයක වින්දිතයා පැමිණ සිටීම බැහැර කිරීමෙන් පමණක් යුක්තිය නිසි ලෙස සුරක්ෂිත කළ හැකි බවට වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත අධිකරණය, කොමිෂන් සභාව හෝ වෙනත් විනිශ්චය සභාවක් තීරණය කරන්නේ නම් මිස, ලසු නොවන නඩු විභාග,

නඩු විභාග, අභියාචනා සහ යම් ප්‍රතිශෝධන ඉල්ලීම් ඇතුළුව, වරදකට අදාළ වන යම් අධිකරණමය හෝ අර්ධ අධිකරණමය නඩු කටයුතුවල දී පැමිණ සිටීමට,

අයිතිවාසිකම තිබිය යුතු ය.

(2) යම් අපරාධයක වින්දිතයකු විසින් ඉල්ලීමක් කිරීමේ දී-

(අ) අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා මගින් හෝ සිදු කර ඇතැයි කියනු ලබන වරද පිළිබඳව විමර්ශනය හෝ පරීක්ෂණය සිදු කරනු ලබන වෙනත් අධිකාරිය මගින්, විමර්ශනයේ හෝ පරීක්ෂණයේ ප්‍රගතිය පිළිබඳව දැනුම්වත් වීම සඳහාඃ

එසේ වුව ද, ඒ තොරතුරු නිදහස් කිරීම සාධාරණ හේතු මත අත්හිටුවනු ලැබිය හැකි ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා, සිදු කර ඇතැයි කියනු ලබන වරද පිළිබඳව විමර්ශනය හෝ පරීක්ෂණය සිදු කරනු ලබන වෙනත් අධිකාරිය, නීතිපතිවරයා හෝ අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මගින්, සිදු කර ඇතැයි කියනු ලබන වරදට අදාළ නඩුව විභාග කිරීම සඳහා නියම කර ඇති දින හෝ අධිකරණ කටයුතුවල ප්‍රගතිය හෝ අධිකරණ කටයුතු අවසන් කිරීම සහ ඒ අධිකරණ කටයුතුවලට අදාළව අපරාධයක වින්දිතයාගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව දැනුම්වත් වීම සඳහා;

(ඇ) අවස්ථාවෝචිත පරිදි, අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා, සිදු කර ඇතැයි කියනු ලබන වරද පිළිබඳව විමර්ශනය හෝ පරීක්ෂණය සිදු කරනු ලබන වෙනත් අධිකාරිය, නීතිපතිවරයා, අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ බන්ධනාගාර අධිකාරීවරයා මගින්-

(i) සැකකරු ඇප මත මුදා හැරීම හෝ නිදහස් කිරීම;

(ii) චූදිතයාට එරෙහිව අපරාධ නඩු කටයුතු ගොනු කිරීම;

(iii) අවස්ථාවෝචිත පරිදි, සැකකරු හෝ චූදිතයා වරදකරු කිරීම, නිදොස් කොට නිදහස් කිරීම, නිදහස් කිරීම හෝ ඔහුට දණ්ඩන නියම කිරීම; හෝ

(iv) සැකකරු හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තා බන්ධනාගාරයෙන් මුදා හැරීම,

යන කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් මීළඟට නඩු කටයුතු සඳහා නියම කර ඇති දිනය පිළිබඳව දැනුම්වත් වීම සඳහා,

අයිතිවාසිකම ඒ අපරාධයක වින්දිතයාට තිබිය යුතු ය.

(3) (අ) අපරාධයක වින්දිතයකු විසින්, සැකකරු හෝ චූදිතයා ඇපමත හෝ අන්‍යාකාරයකින් මුදා හැරීමට අදාළ අධිකරණ නියෝගයේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව සමඟ, නියමිත ආකෘතියෙන් වූ ඉල්ලීමක් ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) වන ඡේදය යටතේ ඉල්ලීමක් ලැබුණු විට අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලීම සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ඊ) වන ඡේදයේ සඳහන් සමාවක් ප්‍රදානය කිරීම හෝ දඬුවමක් ලිහිල් කිරීම පිළිබඳව සලකා බලන බලයලත් තැනැත්තා ජනාධිපතිවරයා වන අවස්ථාවක දී, ඒ කරුණ පිළිබඳව අපරාධයක වින්දිතයාට දැනුම් දීමේ කාර්යය සඳහා ඒ කරුණ අධිකාරියට දැන්වීමේ වගකීම ජනාධිපතිවරයාගේ ලේකම්වරයා වෙත තිබිය යුතු අතර, ඒ බලයලත් තැනැත්තා පළාතක ආණ්ඩුකාරවරයා වන අවස්ථාවක දී ඒ වගකීම ඒ පළාතේ ආණ්ඩුකාරවරයාගේ ලේකම්වරයා වෙත තිබිය යුතු ය.

ඇතැම් ලේඛනවල පිටපත් ලබාගැනීම සඳහා අපරාධයක වින්දිතයකුට ඇති අයිතිවාසිකම

**6.** (1) අපරාධයක වින්දිතයකුට හෝ අපරාධයක වින්දිතයකු වෙනුවෙන් වෙනත් තැනැත්තකුට, සිදු කර ඇතැයි කියනු ලබන වරද පිළිබඳව වන විමර්ශනය, පරීක්ෂණය හෝ නඩු විභාගය සම්බන්ධයෙන් යම් අධිකරණයක හෝ කොමිෂන් සභාවක ගොනු කර ඇති පහත දැක්වෙන ලේඛනවල සහතික කරන ලද පිටපත් ලබා ගැනීම සඳහා ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව වෙත නියමිත ගාස්තුව ගෙවීම මත නියමිත ආකෘතියෙන් වූ ඉල්ලීමක් කිරීමට අයිතිවාසිකම තිබිය යුතු යඃ-

(අ) මරණයකට හේතුව දැක්වෙන ආකෘති පත්‍රය;

(ආ) පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව;

(ඇ) අධිකරණ වෛද්‍ය වාර්තාව;

(ඈ) ඇඟිලි සලකුණු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ වාර්තාව;

(ඉ) රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්තාව; හෝ

(ඊ) ඒ අපරාධයක වින්දිතයාට ප්‍රයෝජනවත් විය හැකි වෙනත් යම් වාර්තාවක්.

(2) (1) වන උපවගන්තියේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේදයේ සඳහන් යම් වාර්තාවක පිටපතක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී ඒ පිළිබඳ දැන්වීමක් නීතිපතිවරයා වෙත ද කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් වෙත ලැබුණු අවස්ථාවක දී-

(අ) අපරාධයක වින්දිතයා විසින් ඒ ආකෘති පත්‍රයේ හෝ වාර්තාවේ අවශ්‍යතාවය ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන්නේ නම්, ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් ඒ ආකෘති පත්‍රය හෝ වාර්තාව නිකුත් කරනු ලැබිය යුතු ය;

(ආ) ඒ ආකෘති පත්‍රය හෝ වාර්තාව නිකුත් කිරීමෙන් දැනට පවත්නා යම් විමර්ශනයකට, පරීක්ෂණයකට, නඩු විභාගයකට හෝ නඩු කටයුත්තකට අගතියක් සිදු විය හැකි බවට ඒ අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ මතය වන්නේ නම්, ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් ඒ ආකෘති පත්‍රය හෝ වාර්තාව නිකුත් නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් යම් ආකෘති පත්‍රයක් හෝ වාර්තාවක් ලබාගැනීමට ඇති අවශ්‍යතාවය ඔප්පු කිරීමේ භාරය ඒ ඉල්ලීම කරනු ලබන තැනැත්තා කෙරෙහි පැවතිය යුතු ය.

මූල්‍ය සහායක් ලබාගැනීමට අපරාධයක වින්දිතයකුට ඇති හිමිකම්

**7.** (1) (අ) සිදු කර ඇතැයි කියනු ලබන වරද; සහ

(ආ) ඒ වරදට අදාළව අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි යම් නඩු කටයුත්තකට සහභාගි වීම,

හේතුවෙන් දැරීමට සිදු වූ වියදම් සලකා බැලීමේ දී, පවත්නා මූල්‍ය පහසුකම් ප්‍රමාණය අනුව, අධිකාරියෙන් සාධාරණ මූල්‍ය සහායක් ඉල්ලා සිටීමට සහ ලබා ගැනීමට අපරාධයක වින්දිතයකුට හිමිකම තිබිය යුතු ය.

(2) අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමාට අත්විඳීමට සිදු වූ යම් හානියක් සම්බන්ධයෙන් සුදුසු වෛද්‍ය සේවා, ඖෂධ සහ වෙනත් වෛද්‍ය පහසුකම් ඇතුළුව යම් වෛද්‍ය ප්‍රතිකාර හෝ මානසිකමය හෝ සමාජයීය සහාය රජයෙන් ඉල්ලා සිටීමට සහ ලබා ගැනීමට අපරාධයක වින්දිතයකුට හිමිකම තිබිය යුතු ය.

(3) ප්‍රජා මූලික සංවිධාන ද ඇතුළු යම් මාර්ගයක් හරහා අවශ්‍ය කරන උපදේශන හෝ පුනරුත්ථාපන සේවා රජයෙන් ඉල්ලා සිටීමට සහ ලබා ගැනීමට අපරාධයක වින්දිතයකුට හිමිකම තිබිය යුතු ය.

(4) (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ යම් ප්‍රතිකාර, සේවා, පහසුකම් හෝ සහාය සඳහා වන ඉල්ලීමක් නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් අධිකාරිය වෙත කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ ඉල්ලීම අනුව ක්‍රියා කොට සුදුසු ප්‍රතිකාර, සේවා, පහසුකම් හෝ සහාය කඩිනම් අයුරින් ඒ අපරාධයක වින්දිතයාට ලබා දීමට කටයුතු සැලැස්විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් මේ පනතේ 67 වන වගන්තිය යටතේ තාවකාලික මුදල් ප්‍රදානයක් ලබා දීමට අධිකාරිය විසින් සලකා බලනු ලැබිය හැකි ය.

වින්දිත බලපෑමේ ප්‍රකාශය

8. (1) සිදු කර ඇතැයි කියනු ලබන වරද, යම් අපරාධයක වින්දිතයකුට ශාරීරිකව, චිත්තවේගීමය ලෙස, මානසිකව, මූල්‍යමය ලෙස, වෘත්තීමය ලෙස හෝ වෙනත් යම් අයුරකින් බලපා ඇති ආකාරය විස්තර කිරීම සඳහා අධිකරණය හෝ කොමිෂන් සභාව වෙත (මේ පනතේ "වින්දිත බලපෑමේ ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රකාශයක් ලිඛිතව ඉදිරිපත් කිරීම සඳහා ඒ අපරාධයක වින්දිතයාට අයිතිවාසිකම තිබිය යුතු ය.

(2) අධිකරණයට හෝ කොමිෂන් සභාවට පිළිගත හැකි යම් හේතුවක් මත ඒ වින්දිත බලපෑමේ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට යම් අපරාධයක වින්දිතයකුට නොහැකි වන හෝ යම් අපරාධයක වින්දිතයකු අපොහොසත් වන අවස්ථාවක දී, අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් අවසර දිය හැකි පරිදි, ඒ අපරාධයක වින්දිතයා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුට ඒ ප්‍රකාශය සිදු කරනු ලැබිය හැකි ය.

(3) වින්දිත බලපෑමේ ප්‍රකාශය-

(අ) වින්දිත පෞද්ගලික ප්‍රකාශයකින්; සහ

(ආ) වින්දිත බලපෑමේ වාර්තාවකින්,

සමන්විත විය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ සඳහන් වින්දිත පෞද්ගලික ප්‍රකාශයක-

(අ) අපරාධයක වින්දිතයා කෙරෙහි වූ වරදේ ශාරීරිකමය, චිත්තවේගීමය, මානසිකමය, මූල්‍යමය, වෘත්තීමය හෝ වෙනත් බලපෑම දක්වනු ලැබිය යුතු ය;

(ආ) අදාළ වන අවස්ථාවල දී, අපරාධයක වින්දිතයාගේ වයස, ස්ත්‍රීපුරුෂ භාවය, ජනවර්ගය, ආගමික විශ්වාසය, ආගම, ලිංගිකත්වය හෝ ආබාධිතබව යන කරුණු මගින් වරද සිදු කිරීමට පෙළඹවීමක් සිදු වී ඇත්ද යන්න පිළිබඳ ප්‍රකාශයක් අන්තර්ගත කරනු ලැබිය හැකි ය;

(ඇ) මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයෙන් අපරාධයක වින්දිතයා වන්දි මුදල් ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ ද යන්න හෝ ඔහුට යම් සහායක් අවශ්‍ය වන්නේ ද යන්න පිළිබඳව සඳහන් කරනු ලැබිය හැකි ය.

(5) (3) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ සඳහන් වින්දිත බලපෑමේ වාර්තාවක් වෛද්‍ය විශේෂඥයකු හෝ මනෝ වෛද්‍ය විශේෂඥයකු විසින් නිකුත් කරන ලද වාර්තාවක් විය යුතු අතර, එහි-

(අ) අපරාධයක වින්දිතයා කෙරෙහි වූ වරදේ චෛතසිකමය කම්පනයේ බලපෑම පිළිබඳ මතයක් අන්තර්ගත විය යුතු ය; සහ

(ආ) අපරාධයක වින්දිතයා කෙරෙහි වූ වරදේ බලපෑමට ආනුෂංගිකව, අපරාධයක වින්දිතයාගේ අවශ්‍යතා තක්සේරුව පිළිබඳ වාර්තාවක් අන්තර්ගත විය යුතු ය.

(6) අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට අපරාධයක වින්දිතයකු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් කරන ලද වින්දිත පෞද්ගලික ප්‍රකාශයක් සහ වින්දිත බලපෑමේ වාර්තාවක් විත්ති පාර්ශ්වයට ලබා දිය යුතු අතර, ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව ඉදිරියෙහි වන යම් නඩු කටයුත්තක දී සාක්ෂි දීම සඳහා ඒ අපරාධයක වින්දිතයා හෝ ඒ ප්‍රකාශය කරනු ලබන වෙනත් තැනැත්තා හෝ ඒ වින්දිත බලපෑමේ වාර්තාව නිකුත් කරන ලද වෛද්‍ය විශේෂඥයා හෝ මනෝ වෛද්‍ය විශේෂඥයා කැඳවනු ලැබිය හැකි ය.

(7) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින්, නඩු කටයුතුවල ඕනෑම අවස්ථාවක දී, විත්ති පාර්ශ්වය වෙත දැන්වීමක් කොට, ඒ අපරාධයක වින්දිතයාගෙන් හෝ ඒ අපරාධයක වින්දිතයා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුගෙන් වින්දිත බලපෑමේ ප්‍රකාශයක් කැඳවිය හැකි අතර, එවිට ඒ වින්දිත බලපෑමේ ප්‍රකාශය සම්බන්ධයෙන් (6) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකම් සහ හිමිකම්

**9.** (1) සාක්ෂිකරුවකුට, සෑම අවස්ථානුගත කරුණක දී ම සාධාරණව ද, ඒ සාක්ෂිකරුගේ අභිමානයට සහ පෞද්ගලිකත්වයට ගෞරවනීය වන ලෙස ද සෑම විට ම සලකනු ලැබිය යුතු ය.

(2) සෑම සාක්ෂිකරුවකුට ම ආරක්ෂාව සඳහා හිමිකම ඇති අතර, ඒ ආරක්ෂාව සැපයීම රජයේ කාර්යය විය යුතු ය.

(3) (අ) සිදු කර ඇතැයි කියනු ලබන වරදකට හෝ යම් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමකට හෝ අයි.සී.සී.පී.ආර් පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අයිතිවාසිකමක් කඩකිරීමකට අදාළව යම් අධිකරණයකට, කොමිෂන් සභාවකට හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට නිදහසේ සහ ස්වේච්ඡාවෙන් යම් තොරතුරක් සැපයීමට හෝ ප්‍රකාශයක් සිදු කිරීමට සාක්ෂිකරුවකුට හිමිකම තිබිය යුතු ය.

(ආ) සාක්ෂි පිළිබඳ නීතිවල විධිවිධානවලට යටත්ව සහ අධිකරණයක හෝ කොමිෂන් සභාවක අභිමතය පරිදි සාක්ෂිකරුවකුට සිතාසියක් භාරදීමට යටත්ව, නිදහසේ සහ ස්වේච්ඡාවෙන් යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි සාක්ෂි දීමට සාක්ෂිකරුවකුට හිමිකම තිබිය යුතු ය.

(4) යම් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට පෙර හෝ යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවතින අතරතුර දී හෝ යම් අධිකරණයක හෝ කොමිෂන් සභාවක නඩු කටයුතු කරගෙන යන අතරතුර දී, යම් සාක්ෂිකරුවකු ඊට සහභාගී වීම අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ සාක්ෂිකරු හිරිහැරයකට, බියගැන්වීමකට, බල කිරීමකට හෝ මේ පනතේ දක්වා ඇති ඔහුගේ අයිතිවාසිකම් හා හිමිකම් උල්ලංඝනය වන ආකාරයක සැලකීමකට ලක් කරනු නොලැබිය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින් යම් වරදක් සිදු කිරීමකට හෝ යම් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමකට හෝ අයි.සී.සී.පී.ආර්. පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අයිතිවාසිකමක් කඩකිරීමකට අදාළව යම් සාක්ෂිකරුවකු විසින්-

(අ) යම් තොරතුරු හෝ සන්නිවේදන සැපයීමේ හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ;

(ආ) විමර්ශනයක් හෝ පරීක්ෂණයක් අතරතුර දී යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට ප්‍රකාශයක් සිදු කිරීමේ හෝ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ;

(ඇ) යම් අධිකරණයක දී හෝ යම් කොමිෂන් සභාවක් ඉදිරියෙහි යම් සාක්ෂි සැපයීමේ හෝ යම් සාක්ෂි ලබා දීමේ;

(ඈ) ඔහු රජයේ නිලධරයකු වශයෙන්, යුක්තිය පසිඳලීමේ දී කවර හෝ ආකාරයකින් සම්බන්ධ වීමේ; හෝ

(ඉ) නඩු කටයුතු පැවරීමේ,

ප්‍රතිඵලයක් ලෙස ඒ සාක්ෂිකරු හට සිදුවන හෝ සිදුවිය හැකි යම් හානියකට, තර්ජනයකට, බියගැන්වීමකට, පළිගැනීමකට හෝ ප්‍රතිප්‍රහාරයකට එරෙහිව ආරක්ෂාව ලබා ගැනීමට ඒ සාක්ෂිකරුට හිමිකම තිබිය යුතු ය.

අපරාධයක වින්දිතයන්ගේ හෝ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ හිමිකම් අහිමි කිරීම පිළිබඳව පැමිණිලි කිරීම

**10.** (1) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් හෝ අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින්, මේ පනතේ මේ කොටසේ නිශ්චිතව සඳහන් යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කරන ලදැයි හෝ අහිමි කරන ලදැයි නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්නව ඇතැයි වන පැමිණිල්ලක් ඒ උල්ලංඝනය කිරීමේ හෝ අහිමි කිරීමේ නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්න වීමේ දින සිට දින තිහක් ඇතුළත අධිකාරිය වෙත වාචිකව හෝ ලිඛිතව කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ පැමිණිල්ලක් වාචිකව කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ පැමිණිල්ල ලද නිලධරයා විසින් වහාම එය ලිඛිතව වාර්තා ගත කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හෝ ඒ පිළිබඳව පරීක්ෂණය කිරීම සඳහා අදාළ වන කාර්ය පටිපාටිය මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි විය යුතු ය.

අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම්වලට හා හිමිකම්වලට ගරුකිරීම සඳහා රජයේ නිලධරයන් සතු කාර්යය

**11.** මේ පනතේ මේ කොටසේ දක්වා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සෑම අධිකරණ නිලධරයකුගේ ම සහ සන්නද්ධ හමුදාවල සහ පොලිස් බලකායේ සෑම සාමාජිකයකුගේ ම ඇතුළුව සෑම රජයේ නිලධරයකුගේ ම කාර්යය විය යුතු ය.

අයිතිවාසිකම්වල සහ හිමිකම්වල සීමා

**12.** මේ පනතේ මේ කොටසේ සඳහන් කිසිවක් මගින් -

(අ) මේ පනතේ මේ කොටසේ සඳහන් අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම්වලට සහ හිමිකම්වලට අදාළව නිශ්චිත වියදම් දැරීම සඳහා රජයේ අධිකාරියකට නියම කිරීමට යම් තැනැත්තකුට අයිතිවාසිකමක් ලබා දෙන ලෙස; හෝ

(ආ) මේ පනතේ මේ කොටසේ සඳහන් අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම්වලට සහ හිමිකම්වලට අදාළව වියදම් දැරීම සඳහා රජයේ අධිකාරියකට නියම කරන ලෙස,

තේරුම් නොගත යුතු ය.

වින්දිතයන්ගේ තොරතුරු ලේඛනය

**13.** (1) අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් සහ අපරාධයක වින්දිතයන් පිළිබඳ යම් තොරතුරු ඇතුළත් කරමින් "වින්දිතයන්ගේ තොරතුරු ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන ලේඛනයක් අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු සපයමින්, තමා විසින් ම හෝ නීතිඥවරයකු මගින් කරනු ලබන ඉල්ලීමක් මත, වින්දිතයන්ගේ තොරතුරු ලේඛනයෙහි තමා ලියාපදිංචි කරන ලෙස අපරාධයක වින්දිතයකු විසින් අධිකාරියෙන් ඉල්ලා සිටිය හැකි ය.

(3) වින්දිතයන්ගේ තොරතුරු ලේඛනයෙහි ලියාපදිංචි වීමෙන් පසුව, අධිකාරිය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, වරදකරු

සම්බන්ධයෙන් පහත සඳහන් ඕනෑම කාරණයක් පිළිබඳව තොරතුරු අධිකාරියෙන් ලබා ගැනීමට අපරාධයක වින්දිතයකුට හිමිකම තිබිය යුතු යː-

(අ) වරදකරුට පනවනු ලැබූ දඬුවම පිළිබඳව;

(ආ) වරදකරු අත්අඩංගුවෙන් පැන යාමේ සහ යළි අල්ලා ගැනීමේ යම් සිදුවීමක් ඇතොත් ඒ පිළිබඳව;

(ඇ) වරදකරු අත්අඩංගුවෙන් නිදහස් කිරීමට නියමිත දිනයන් පිළිබඳව; හෝ

(ඈ) වරදකරු, වරදකරු කිරීමට සහ ඔහුට දඬුවම් ලබා දීමට එරෙහිව වූ අභියාචනා ඇතොත් ඒ පිළිබඳව.

(4) අපරාධයක වින්දිතයකු විසින් (3) වන උපවගන්තිය යටතේ ඉල්ලා සිටින ලද තොරතුරු අප්‍රමාදව, ලිඛිතව ලබා දීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(5) අධිකාරිය, වින්දිතයන්ගේ තොරතුරු ලේඛනයෙහි ඇතුළත් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් පිළිබඳ තොරතුරු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු අතර, නීතිය මගින් නියම කර ඇති ආකාරයට හැර ඒ යම් තොරතුරක් හුවමාරු කරනු නොලැබිය යුතු ය.

III වන කොටස

**අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහි වැරදි**

**14.** යම් තැනැත්තකු විසින්-

අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු බියගැන්වීම

(අ) යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු තැති ගැන්වීමේ;

(ආ) (i) ඒ තැනැත්තාට එරෙහිව නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන්; හෝ

(ii) ඒ තැනැත්තාට එරෙහිව යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී සාක්ෂි දීමෙන්,

යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වැළැක්වීමේ; හෝ

(ඇ) ඒ තැනැත්තාට එරෙහිව කරනු ලැබූ පැමිණිල්ලක් හෝ පවරනු ලැබූ නඩු කටයුත්තක් ඉල්ලා අස්කර ගන්නා ලෙස යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට බල කිරීමේ,

අරමුණින් ඒ අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ ශරීරයට, කීර්ති නාමයට හෝ දේපළවලට නැතහොත් ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට සම්බන්ධයක් ඇති වෙනත් යම් තැනැත්තකුගේ ශරීරයට, කීර්ති නාමයට හෝ දේපළවලට හානියක් සිදු කරන බවට තර්ජනය කරතහොත් ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක්ලක්ෂ පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය. ඊට අමතරව, රුපියල් ලක්ෂ පහකට නොවැඩි වන්දි මුදලක් ගෙවන ලෙසට ද ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට තුවාල සිදු කිරීම

**15.** යම් තැනැත්තකු විසින්-

(අ) (i) ඒ තැනැත්තාට එරෙහිව නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන්; හෝ

(ii) ඒ තැනැත්තාට එරෙහිව යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී සාක්ෂි දීමෙන්,

යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වැළැක්වීමේ;

(ආ) ඒ තැනැත්තාට එරෙහිව කරනු ලැබූ පැමිණිල්ලක් හෝ පවරනු ලැබූ නඩු කටයුත්තක් ඉල්ලා අස්කර ගන්නා ලෙස යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට බලකිරීමේ; හෝ

(ඇ) ඒ තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක දී හෝ යම් කොමිෂන් සභාවක් ඉදිරියෙහි යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් සිදු කරන ලද ප්‍රකාශයක් හෝ සපයන ලද සාක්ෂියක් සඳහා ප්‍රතිහිංසා කිරීමේ,

අරමුණින් ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට ස්වේච්ඡාවෙන් තුවාල හෝ බරපතළ තුවාල සිදු කරතහොත් ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් වියයුතු ය.

**16.** යම් තැනැත්තකු විසින්- (අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට අවහිර කිරීම)

(අ) (i) ඒ තැනැත්තාට එරෙහිව නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන්; හෝ

(ii) ඒ තැනැත්තාට එරෙහිව යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී සාක්ෂි දීමෙන්,

යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වැළැක්වීමේ;

(ආ) ඒ තැනැත්තාට එරෙහිව කරනු ලැබූ පැමිණිල්ලක් හෝ පවරනු ලැබූ නඩු කටයුත්තක් ඉල්ලා අස්කර ගන්නා ලෙස යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට බලකිරීමේ; හෝ

(ඇ) ඒ තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක දී හෝ යම් කොමිෂන් සභාවක් ඉදිරියෙහි යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් සිදු කරන ලද ප්‍රකාශයක් හෝ සපයන ලද සාක්ෂියක් සඳහා ප්‍රතිහිංසා කිරීමේ,

අරමුණින් ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට අයුතු ලෙස අවහිර කරතහොත් ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

යම් ස්ථානයකින් පිටමං කිරීම සඳහා අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට බලපෑම් කිරීම හෝ පෙළඹවීම හෝ අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ දේපළවලට පාඩු හෝ අලාභ සිදු කිරීම

**17.** යම් තැනැත්තකු විසින් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට ඒ තැනැත්තාට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් හෝ යම් ප්‍රකාශයක් සිදු කිරීමෙන් හෝ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී ඒ තැනැත්තාට එරෙහිව සාක්ෂි දීමෙන් යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වළක්වනු ලැබීමේ අරමුණින් හෝ අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් ඒ තැනැත්තාට එරෙහිව නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත සිදු කරන ලද ප්‍රකාශයක් හේතුවෙන් හෝ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී ඒ තැනැත්තාට එරෙහිව දෙන ලද සාක්ෂියක් හේතුවෙන් ඊට ප්‍රතිහිංසා කිරීමක් වශයෙන්-

(අ) ඒ අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු යම් ස්ථානයකින් පිටමං කිරීම සඳහා බලපෑම් කරතහොත් හෝ වංචා සහගත උපක්‍රම මගින් හෝ බලය අනිසි ලෙස යෙදීමෙන් හෝ වෙනත් යම් නීතිවිරෝධී ක්‍රමයකින් පොලඹවනු ලැබුවහොත් හෝ බල කරනු ලැබුවහොත්; හෝ

(ආ) අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට නීත්‍යානුකූල හිමිකමක් ඇති දේපළකට යම් පාඩුවක්, අලාභයක් හෝ විනාශයක් සිදු කිරීමේ අදහසින් හෝ එසේ සිදු විය හැකි බව දනිමින් ඒ දේපළවලට ඒ පාඩුව, අලාභය හෝ විනාශය සිදු කරතහොත්,

ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ

තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය. ඊට අමතරව, ඒ තැනැත්තා විසින් අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ දේපළවලට සිදු කරන ලද පාඩුව, අලාභය හෝ විනාශය සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවිය යුතු බවට අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි යම් වන්දියක් ද ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

සේවා ස්ථානයේ දී තැනැත්තකුට හිරිහැර කිරීම

**18.** යම් තැනැත්තකු විසින් යම් වරදක් සිදු කිරීමකට හෝ යම් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමකට හෝ අයි.සී.සී.පී.ආර් පනත යටතේ වූ යම් අයිතිවාසිකමක් කඩ කිරීමකට අදාළව වෙනත් යම් තැනැත්තකු විසින්-

(අ) යම් තොරතුරු සැපයීමේ හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ;

(ආ) යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට, අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට ප්‍රකාශයක් සිදු කිරීමේ;

(ඇ) යම් අධිකරණයක දී හෝ යම් කොමිෂන් සභාවක් ඉදිරියෙහි යම් සාක්ෂියක් ලබා දීමේ; හෝ

(ඈ) නඩු කටයුත්තක් පැවරීමේ,

ප්‍රතිඵලයක් වශයෙන්, ඒ වෙනත් තැනැත්තාට යම් හිරිහැරයක්, බලකිරීමක්, ශාරීරික හෝ මානසික වේදනාවක් හෝ ඒ වෙනත් තැනැත්තාගේ සේවා ස්ථානයේ සේවා කොන්දේසිවල අහිතකර වෙනස්කමක් සිදු කරතහොත් ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**නඩු කටයුතු වැළැක්වීම ආදිය සඳහා අල්ලස් ප්‍රදානය කිරීම**

**19.** වරදක් සිදු කර ඇතැයි කියනු ලබන, සැක කරනු ලබන හෝ චෝදනා කරනු ලබන යම් තැනැත්තකු විසින්-

(අ) ඒ වරද සිදු කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට එරෙහිව නඩු කටයුතු පැවරීමට අදහස් කරන හෝ සූදානම් වන; හෝ

(ආ) යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට, අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට ඒ තැනැත්තාට එරෙහිව තොරතුරු හෝ සාක්ෂි සැපයීමට ඉඩ ඇති,

වෙනත් තැනැත්තකුට, ඒ පළමුව සඳහන් කළ තැනැත්තාට එරෙහිව නඩු කටයුතු පැවරීම හෝ සත්‍ය තොරතුරු හෝ සාක්ෂි සැපයීම වැළැක්වීමේ, අධෛර්යයට පත් කිරීමේ හෝ අවහිර කිරීමේ අරමුණින් යම් අල්ලසක් ප්‍රදානය කරතහොත්, සපයතහොත් හෝ ලබාදෙතහොත්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**තොරතුරු හෙළිදරව් කිරීම**

**20.** (අ) සිදු කර ඇතැයි කියනු ලබන වරදක් පිළිබඳව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් ආරම්භ කිරීමේ හෝ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා සපයන ලද යම් තොරතුරු ලැබී ඇති;

(ආ) සිදු කර ඇතැයි කියනු ලබන වරදක් පිළිබඳව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සිදු කරන අතරතුර දී යම් තොරතුරු රැස්කර ඇති; හෝ

(ඇ) වෙනත් තැනැත්තකුගෙන් (අ) වන හෝ (ආ) වන ඡේදයේ සඳහන් යම් තොරතුරු ලැබී ඇති,

යම් තැනැත්තකු විසින්, විශේෂයෙන් ම, අපරාධයක වින්දිතයකුගේ, සාක්ෂිකරුවකුගේ හෝ ඔත්තුකරුවකුගේ අනන්‍යතාවට අදාළ ඒ

යම් තොරතුරු හෝ එහි කොටසක් තුන්වන තැනැත්තකුට සැපයීම, නිකුත් කිරීම හෝ ලබාදීම, ප්‍රසිද්ධියට පත් කිරීම නැතහොත් අන්‍යාකාරයෙන් බෙදාහැරීම සිදු කර එමගින් ඒ අපරාධයක වින්දිතයාගේ, සාක්ෂිකරුගේ හෝ ඔත්තුකරුගේ ජීවිතය අනතුරට ලක් කරතහොත්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු යඃ

එසේ වුව ද, ඒ තොරතුරු සැපයීම, නිකුත් කිරීම හෝ ලබා දීම, ප්‍රසිද්ධියට පත්කිරීම නැතහොත් බෙදාහැරීම සද්භාවයෙන් සිදු කිරීම සහ-

(i) නීතියක යම් විධිවිධානයකට හෝ නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියකට;

(ii) අධිකරණයක් විසින් කරන ලද නියෝගයකට; හෝ

(iii) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ විධානයක් නිකුත් කිරීමට නිසි බලයලත් තැනැත්තකු විසින් නිකුත් කරන ලද විධානයකට,

අනුව හෝ අනුකූලව සිදු කිරීම වරදක් නොවිය යුතු ය.

අසත්‍ය තොරතුරු සැපයීම

**21.** අධිකාරියෙන්, ආරක්ෂක කොට්ඨාසය ඇතුළු පොලිසියෙන්, අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් යම් සහායක් හෝ ආරක්ෂාවක් ලබා ගැනීමේ අරමුණින්, දැන දැනම අසත්‍ය තොරතුරක් සපයන හෝ අසත්‍ය යයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති තොරතුරක් සපයන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**22.** (අ) අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සැපයීම භාරව සිටින හෝ ආරක්ෂාව සපයනු ලබන හෝ ආරක්ෂාව සැපයීමේ දී සහාය වන; හෝ

ආරක්ෂාව සපයන තැනැත්තකු විසින් තොරතුරු හෙළිදරව් කිරීම

(ආ) අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සපයනු ලබන ආරක්ෂාවට අදාළ වන යම් තොරතුරු අන්‍යාකාරයෙන් සන්තකයේ දරන,

යම් තැනැත්තකු විසින්, ඒ තොරතුරු වෙනත් තැනැත්තකුට සැපයීමෙන්, නිකුත් කිරීමෙන් හෝ ලබාදීමෙන් ඒ අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ ජීවිතය අනතුරට ලක් කරතහොත් ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු යः

එසේ වුව ද, ඒ තොරතුරු සැපයීම, නිකුත් කිරීම හෝ ලබා දීම සද්භාවයෙන් සිදු කිරීම සහ -

(i) නීතියක යම් විධිවිධානයකට හෝ නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියකට;

(ii) අධිකරණයක් විසින් කරන ලද නියෝගයකට; හෝ

(iii) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ විධානයක් නිකුත් කිරීමට නිසි බලයලත් තැනැත්තකු විසින් නිකුත් කරන ලද විධානයකට,

අනුව හෝ අනුකූලව සිදු කිරීම වරදක් නොවිය යුතු ය.

**23.** 14 වන, 15 වන, 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන හෝ 22 වන වගන්තියේ සඳහන් යම් වරදක් සිදු කිරීමට තැත්කරන, ඒ යම් වරදක් සිදු කිරීමට වෙනත් තැනැත්තකු පොළඹවන හෝ වෙනත් තැනැත්තකුට චේතනාන්විතව ආධාර දෙන හෝ අනුබල

වරදක් සිදු කිරීමට තැත් කිරීම, පෙළඹවීම, ආධාර දීම ආදිය

දෙන, නැතහොත් ඒ යම් වරදක් සිදු කිරීමට යම් කුමන්ත්‍රණයක යෙදෙන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, ඒ වගන්තියේ ඒ වරද සඳහා පනවනු ලැබ ඇති දඬුවමට ම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

14 වන, 15 වන, 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන හෝ 23 වන වගන්තිය යටතේ වූ වරදක් සංඥෙය සහ ඇපදිය හැකි වරදක් බව

**24.** (1) (අ) 14 වන, 15 වන, 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන හෝ 23 වන වගන්තිය යටතේ වූ වරදක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් විය යුතු අතර, 1997 අංක 30 දරන ඇප පනතේ අර්ථානුකූලව ඇප දිය හැකි වරදක් විය යුතු ය.

(ආ) යම් තැනැත්තකු ඇප මත මුදා හැරීමේ දී, අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු සමග හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු සමග සන්නිවේදනය කිරීම හෝ ඔවුන් සමීපයට පැමිණීම තහනම් කරමින් ඒ නියෝගයේ කොන්දේසියක් නියම කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලය තිබිය යුතු ය.

(2) 14 වන, 15 වන, 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන හෝ 23 වන වගන්තිය යටතේ යම් වරදක් සිදු කර ඇතැයි චෝදනා ලැබූ තැනැත්තකුට එරෙහිව පවත්වන නඩු විභාගයක්, ඒ අධිකරණයේ වෙනත් යම් නඩු කටයුත්තක් ඇසීමට පෙරාතුව විභාගයට ගත යුතු අතර, විශේෂයෙන් වාර්තාගත කළ යුතු නොවැළැක්විය හැකි අවස්ථානුගත හේතු මත මිස, දිනපතා පවත්වාගෙන යා යුතු අතර, විභාගය අතරතුර දී ඒ නඩු කල් දැමීම ද නොකළ යුතු ය.

(3) සිදු කර ඇතැයි කියනු ලබන යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු ඇප මත සිටින අදාළ කාලය තුළ දී ඒ තැනැත්තා විසින් මේ පනතේ 14 වන, 15 වන, 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන හෝ 23 වන වගන්තිය යටතේ වූ වරදක් සිදු කර ඇති බවට නිගමනය කිරීම සඳහා බැලූ බැල්මට පෙනෙන කරුණු ඇති බවට පරීක්ෂණයක් කිරීමෙන් පසුව අධිකරණයක් විසින් අනාවරණය කර ගනු ලැබුවේ නම්, ඒ තැනැත්තාට ඇප ප්‍රදානය කරනු ලැබූ අධිකරණය විසින් ඒ ඇප

අවලංගු කරනු ලැබිය යුතු අතර, ඒ අධිකරණය විසින් සාධාරණ යයි සලකනු ලැබිය හැකි යම් කාල සීමාවක් සඳහා ඒ තැනැත්තා රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබිය යුතු ය.

දඬුවම තීරණය කිරීම

**25.** (1) මේ පනත යටතේ යම් වරදක් සඳහා සුදුසු දඬුවම තීරණය කිරීමේ දී, අධිකරණය විසින් ඒ වරද සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ හෝ වෙනත් යම් නීතියක නියම කර ඇති දඬුවම සහ දඬුවම් පැනවීම සම්බන්ධයෙන් වන දඬුවම් ලබා දීමේ ප්‍රතිපත්තිවලට අදාළව අභියාචන අධිකරණ බලය ඇති අධිකරණ විසින් දෙනු ලැබ ඇති තීරණ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(2) එක් එක් වරදෙහි බරපතළ කිරීමේ සහ ලිහිල් කිරීමේ අවස්ථානුගත තත්ත්වයන් කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(3) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දඬුවම් ලබා දීමේ ප්‍රතිපත්තියට අදාළව මේ පනත යටතේ මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.

මේ පනතේ මේ කොටස යටතේ වන වැරදි සම්බන්ධයෙන් පැමිණිලි කිරීම

**26.** (1) මේ පනතේ මේ කොටස යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක්-

(අ) ආරක්ෂක කොට්ඨාසය;

(ආ) අධිකාරිය; හෝ

(ඇ) යම් අධිකරණයක්, කොමිෂන් සභාවක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත,

නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් සහ ආකාරයකින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) වන හෝ (ඇ) වන ඡේදය යටතේ යම් පැමිණිල්ලක් අධිකාරිය හෝ යම් අධිකරණයක්, කොමිෂන් සභාවක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත ලැබුණු අවස්ථාවක දී, ඒ පැමිණිල්ල, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සිදු කිරීම සඳහා වහාම ආරක්ෂක කොට්ඨාසය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ආරක්ෂාව ලබා ගැනීමට අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ඇති හිමිකම

*ආරක්ෂාව ලබා ගැනීමට ඇති හිමිකම*

**27.** යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වීමට අදාළ අවස්ථානුගත කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන් ඒ අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු යම් හානියකට, හිංසාවකට, බියගැන්වීමකට, පළිගැනීමකට හෝ ප්‍රතිප්‍රහාරයකට ලක් විය හැකි බව විශ්වාස කිරීමට ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට හෝ ඒ අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක මේ පනතේ මේ කොටසේ විධිවිධාන ප්‍රකාරව ආරක්ෂාව සඳහා ඉල්ලීමක් කිරීමට ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට හෝ ඒ වෙනත් තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

*අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් ඉල්ලා සිටිය හැකි ආරක්ෂාවේ ස්වභාවය*

**28.** (1) මේ පනතේ මේ කොටස යටතේ යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සපයනු ලැබිය හැකි ආරක්ෂාවේ ස්වභාවයට පහත දැක්වෙන දෑ ඇතුළත් විය හැකි ය:-

(අ) ඒ තැනැත්තාට හෝ දේපළවලට ආරක්ෂාව සැපයීම;

(ආ) නඩත්තුව සඳහා වන පහසුකම් ඇතුළුව, තාවකාලික නවාතැන් සැපයීම;

(ඇ) අවස්ථාවෝචිත පරිදි, අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ කැමැත්ත ඇතිව, ස්ථිරව හෝ තාවකාලිකව ප්‍රතිස්ථානගත කිරීම;

(ඈ) සම්පූර්ණ නඩු කටයුත්ත හෝ එහි කොටසක් අප්‍රසිද්ධියේ පැවැත්වීම;

(ඉ) අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ අනන්‍යතාවය වසන් කිරීම;

(ඊ) අපරාධයක ළමා වින්දිතයකු හෝ ළමා සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් වන විට දී, ඔහුගේ උපරිම යහපත සහතික කිරීමට සහ අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිවාසිකම ඇතුළුව ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විශේෂ පියවර ගැනීම;

(උ) නඩු විභාගය, විමර්ශනය හෝ පරීක්ෂණය පවත්වන ස්ථානයට චූදිතයාගේ පැමිණීම මගින් විය හැකි හිරිහැර, බියගැන්වීම්, බලකිරීම් හෝ බලපෑම්වලින් අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම;

(ඌ) අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ අනන්‍යතාවය සහ පසුබිම් තොරතුරු මුද්‍රිත මාධ්‍යවල හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යවල ඇතුළුව අනාවරණය කිරීමෙන් වැළැක්වීම;

(එ) නඩු විභාගයට පෙර අනාවරණය කිරීමේ කාර්ය සඳහා නීතියෙන් අවසර දී ඇති පරිදි හැර, අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු විසින් සපයනු ලැබිය හැකි සාක්ෂි අනාවරණය කිරීමෙන් වැළැක්වීමට සුදුසු පියවර ගැනීම;

(ඒ) සුදුසු අවස්ථාවල දී, තාවකාලික හෝ ස්ථිර සේවා නියුක්තීන් සපයා දීම; සහ

(ඔ) අධිකරණයක්, කොමිෂන් සභාවක්, අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් අවශ්‍ය යයි සලකන වෙනත් යම් පියවර ගැනීම.

(2) අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට (1) වන උපවගන්තියේ සඳහන් ආරක්ෂාව හෝ සහාය ලබා දීමේ යම් පියවරක් ගැනීමේ දී අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් යම් රජයේ අධිකාරියකින් හෝ යම් රජයේ නිලධරයකුගෙන් සහාය ඉල්ලා සිටිය හැකි අතර, එවැනි ඉල්ලීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී සඳහන් කරනු ලැබිය යුතු හේතු මත එසේ කිරීමට ඒ රජයේ අධිකාරියට හෝ නිලධරයාට නොහැකි නම් මිස, ඉල්ලා සිටි පරිදි අධිකාරියට හෝ ආරක්ෂක කොට්ඨාසයට සහාය ලබා දීම ඒ රජයේ අධිකාරියේ හෝ රජයේ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

ආරක්ෂාව ලබාගැනීම සඳහා වන ඉල්ලීම

**29.** (1) මේ පනතේ මේ කොටස යටතේ ආරක්ෂාව ඉල්ලා සිටින අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් නියමිත ආකෘතියෙන් සහ ආකාරයෙන් වූ ඉල්ලීමක්-

(අ) අධිකාරිය;

(ආ) ආරක්ෂක කොට්ඨාසය;

(ඇ) යම් පොලිස් ස්ථානයක්;

(ඈ) යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක්; හෝ

(ඉ) යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ රජයේ නිලධරයෙක්,

වෙත කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) වන, (ඈ) වන හෝ (ඉ) වන ඡේදය යටතේ ආරක්ෂාව සඳහා ලද ඉල්ලීම මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට දී, ඒ ඉල්ලීම අප්‍රමාදව අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) වන, (ආ) වන, (ඇ) වන හෝ (ඉ) වන ඡේදය යටතේ ආරක්ෂාව සඳහා ලද ඉල්ලීම මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර නොමැති වරදක් සම්බන්ධයෙන් වන විට දී, ඒ ඉල්ලීම අප්‍රමාදව අදාළ පොලිස් ස්ථානය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වැරදි සම්බන්ධයෙන් තර්ජනයේ බරපතලකම පිළිබඳ තක්සේරුව

**30.** (1) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වරදක් සම්බන්ධයෙන් ආරක්ෂාව සඳහා 29 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට හෝ යොමු කරනු ලැබූ විට-

(අ) ඒ ඉල්ලීම අධිකාරිය විසින් ලද හෝ අධිකාරිය වෙත යොමු කරනු ලබන අවස්ථාවක දී, අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සම්බන්ධයෙන් තර්ජනයේ බරපතලකම පිළිබඳ තක්සේරුවක් සිදු කිරීමට කටයුතු සැලැස්වීම සඳහා අධිකාරිය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු ය; හෝ

(ආ) ඒ ඉල්ලීම ආරක්ෂක කොට්ඨාසය විසින් ලද හෝ ආරක්ෂක කොට්ඨාසය වෙත යොමු කරනු ලබන අවස්ථාවක දී, අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සම්බන්ධයෙන්

තර්ජනයේ බරපතලකම පිළිබඳ තක්සේරුවක් සිදු කිරීම සඳහා ආරක්ෂක කොට්ඨාසය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු ය:

තව ද, ඒ තර්ජනයේ බරපතලකම පිළිබඳ තක්සේරුවෙන් අනාවරණය වන කරුණු මත පදනම් ව, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් අවශ්‍ය ආරක්ෂාව වහාම සැපයීම සඳහා සුදුසු පියවර ගනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ මේ කොටස යටතේ කරන ලද ආරක්ෂාව සඳහා වන යම් ඉල්ලීමක් රහස්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

**දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර නොමැති වැරදිවලට අදාළව ආරක්ෂාව**

**31.** (1) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර නොමැති වරදක් සම්බන්ධයෙන් ආරක්ෂාව සඳහා 29 වන වගන්තිය යටතේ ඉල්ලීමක් පොලිස් ස්ථානයක් වෙත ලැබුණු හෝ යොමු කරන ලද අවස්ථාවක දී, 38 වන වගන්තිය යටතේ ඒ පොලිස් ස්ථානයට පත් කරන ලද ආරක්ෂක නිලධරයා විසින් තර්ජනයේ බරපතලකම පිළිබඳ තක්සේරුවක් වහාම කරනු ලැබිය යුතු අතර, ඒ තර්ජනයේ බරපතලකම පිළිබඳ තක්සේරුවෙන් අනාවරණය වන කරුණු මත පදනම්ව සහ ප්‍රදේශයේ පොලිස් අධිකාරීවරයාගේ එකඟත්වය ඇතිව අපරාධයේ වින්දිතයාට හෝ සාක්ෂිකරුට අවශ්‍ය ආරක්ෂාව සපයනු ලැබිය යුතු ය.

(2) (අ) දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර නොමැති වරදක් සම්බන්ධයෙන් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට බරපතල තර්ජනයක් ඇති බවට අධිකාරියේ, ආරක්ෂක කොට්ඨාසයේ හෝ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක දී; හෝ

(ආ) ප්‍රදේශයේ පොලිස් ස්ථානය පක්ෂපාතී බවට අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු චෝදනා කරනු ලබන අවස්ථාවක දී,

ආරක්ෂක කොට්ඨාසය විසින් ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට සුදුසු ආරක්ෂාව සැපයීම සඳහා කටයුතු කරනු ලැබිය යුතු ය.

නඩු කටයුතු සම්බන්ධයෙන් අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ කාර්යය

**32.** (1) යම් නඩු කටයුත්තක දී අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට හිංසාවකින්, බියගැන්වීමකින්, පළිගැනීමකින් හෝ ප්‍රතිප්‍රහාරයකින් ආරක්ෂාව අවශ්‍ය වන බවට හෝ යම් නඩු කටයුත්තකට පැමිණීමට සහ සහභාගී වීමට සහාය අවශ්‍ය වන බවට විශ්වාස කිරීමට අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට සාධාරණ හේතු ඇති කවර හෝ අවස්ථාවක දී, ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට ඒ ආරක්ෂාව සැපයීමට හෝ ඒ ආරක්ෂාව සැපයීමට කටයුතු සැලැස්වීමට අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙසට අධිකාරියට, ආරක්ෂක කොට්ඨාසයට, පොලිස් ස්ථානයකට හෝ වෙනත් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට විධාන කරනු ලැබිය හැකි අතර, අධිකාරිය, ආරක්ෂක කොට්ඨාසය, ඒ පොලිස් ස්ථානය හෝ ඒ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් අප්‍රමාදව ඒ විධානයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින් නිකුත් කරන ලද විධානයකට අනුකූලව කටයුතු කිරීමේ දී, අධිකාරිය, ආරක්ෂක කොට්ඨාසය, පොලිස් ස්ථානය හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට අවශ්‍ය ආරක්ෂාව පිළිබඳ මූලික අවශ්‍යතා තක්සේරුවක් සිදු කර අවශ්‍ය විය හැකි පරිදි ඒ ආරක්ෂාව සපයනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ආරක්ෂාව සැපයීමෙන් පසුව, 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන සහ (ආ) වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති ආරක්ෂාව සැපයීම නතර කිරීමේ යම් හේතුවක් පවතින බව අධිකාරියේ, ආරක්ෂක කොට්ඨාසයේ, පොලිස් ස්ථානයේ හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියේ මතය වන කවර හෝ අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි අධිකාරිය, ආරක්ෂක කොට්ඨාසය, පොලිස් ස්ථානය හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් ඒ කරුණු හේතු ද සහිතව ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු අතර, ඉන් පසුව ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් එසේ ආරක්ෂාව සැපයීම නතර කරන ලෙස නියෝග කරනු ලැබිය හැකි ය.

(4) යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි යම් නඩු කටයුත්තක් පැවැත්වීමට පෙර හෝ ඒ නඩු කටයුත්ත පවත්වන

අතරතුර හෝ ඒ නඩු කටයුත්ත පැවැත්වීමෙන් පසුව හෝ යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු යම් හානියකට, හිංසාවකට, හිරිහැර කිරීමකට, බිය ගැන්වීමකට හෝ ප්‍රතිප්‍රහාරයකට ලක් වීමට ඉඩ ඇති බවට යම් තොරතුරක් හෝ ඒ අපරාධයක වින්දිතයාගෙන් හෝ සාක්ෂිකරුගෙන් යම් ඉල්ලීමක් හෝ පැමිණිල්ලක් ලද විගස, අධිකාරිය, ආරක්ෂක කොට්ඨාසය, පොලිස් ස්ථානයක් හෝ වෙනත් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට අවශ්‍ය ආරක්ෂාව සපයනු ලැබිය හැකි ය.

නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් විසින් සහ රජයේ නිලධරයන් විසින් ආරක්ෂාව සැපයිය යුතු බව

**33.** (1) යම් නීතියක් යටතේ යම් නඩු කටයුත්තකට පැමිණීමේ දී සහ සහභාගි වීමේ දී සිදු විය හැකි යම් හිංසාවකින්, බියගැන්වීමකින්, පළිගැනීමකින් හෝ ප්‍රතිප්‍රහාරයකින් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු හට ආරක්ෂාව අවශ්‍ය වන බව විශ්වාස කිරීමට යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට හෝ රජයේ නිලධරයකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, ඒ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය හෝ රජයේ නිලධරයා විසින් අධිකාරියට හෝ ආරක්ෂක කොට්ඨාසයට ඒ සම්බන්ධයෙන් වහාම නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ආරක්ෂාවක් සැපයීමට සහ ආරක්ෂාවක් සැපයීම සම්බන්ධයෙන් 29 වන, 30 වන සහ 31 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

අවදානමකට ලක් විය හැකි අපරාධයක වින්දිතයන් හෝ සාක්ෂිකරුවන් සඳහා වන විශේෂ ක්‍රියාමාර්ග

**34.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අවදානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් හෝ අවදානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වෙනුවෙන් ඉල්ලීමක් කරනු ලැබීමේ දී, අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින්, ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට ආරක්ෂාව සැපයීම සඳහා, නියම කරනු ලැබිය හැකි යම් විශේෂ ක්‍රියාමාර්ග ගන්නා ලෙසට අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය වෙත නියෝග කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා විශේෂ ක්‍රියාමාර්ග නියම කිරීමේ දී අධිකාරියේ නිර්දේශ ඉල්ලා සිටිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් විශේෂ ක්‍රියාමාර්ග ගන්නා ලෙසට නියෝග කිරීමේ දී, අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් එහි නඩු කටයුතුවල දී සාධාරණ නඩු විභාග මූලධර්ම ආරක්ෂා කරනු ලබන බව සහතික කරනු ලැබිය යුතු ය.

(4) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අවදානමකට ලක්විය හැකි බව නිශ්චය කිරීමේ දී පහත දැක්වෙන කරුණු ද සලකා බැලිය හැකි යඃ-

(අ) සිදු කර ඇතැයි කියනු ලබන වරදේ ස්වභාවය සහ ඒ හා සම්බන්ධ අවස්ථානුගත කරුණු;

(ආ) සාක්ෂිකරු විසින් ලබා දීමට හෝ සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන සාක්ෂියේ හෝ ප්‍රකාශයේ ස්වභාවය;

(ඇ) අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සහ චූදිතයා අතර ඇති යම් සම්බන්ධතාවයක්;

(ඈ) අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ වයස සහ බුද්ධි මට්ටම;

(ඉ) අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ පවුලේ සාමාජිකයන් හෝ ආශ්‍රිතයන් නැතහොත් අපරාධයේ වින්දිතයාට හෝ සාක්ෂිකරුට සමීප ඥාතීත්වයක් ඇති තැනැත්තකු කෙරෙහි චූදිතයාගේ හැසිරීම හෝ ආකල්ප ඇතුළුව අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු කෙරෙහි චූදිතයාගේ හැසිරීම හෝ ආකල්ප; සහ

(ඊ) අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ ජනවාර්ගික, සමාජයීය සහ සංස්කෘතික පසුබිම, පරිවර්තිත ලිංගිකත්වය ඇතුළු ස්ත්‍රීපුරුෂ භාවය, ලිංගික දිශානතිය, සමාජ ආන්තිකකරණයට ලක් වීමේ ඉඩකඩ, ගෘහස්ථ හෝ සේවා නියුක්ති අවස්ථානුගත කරුණු, ආගමික හෝ දේශපාලන විශ්වාස සහ අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු පෙළෙමින් සිටින යම් ශාරීරික ආබාධයක් හෝ දුබලතාවයක් ඇතුළුව වෙනත් යම් අදාළ කාරණයක්.

(5) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින්-

(අ) ලිංගික වැරදි හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වන නඩු කටයුතුවල දී, අපරාධයක ළමා වින්දිතයකුට හෝ ළමා සාක්ෂිකරුවකුට ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව ඉදිරියෙහි පෞද්ගලිකව පෙනී සිටීමට නියම කිරීමෙන් තොරව, දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි දීමට හෝ ප්‍රකාශයක් සිදු කිරීමට ඒ අපරාධයක ළමා වින්දිතයාට හෝ ළමා සාක්ෂිකරුට අවසර දෙනු ලැබිය හැකි ය; හෝ

(ආ) යම් අවදානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට දිවුරුමක හෝ ප්‍රතිඥාවක ස්වභාවය අවබෝධ කර ගැනීමට නොහැකි බවට සෑහීමට පත් වීමෙන් පසුව, දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ගැනීමකින් තොරව සාක්ෂි දීමට හෝ ප්‍රකාශයක් සිදු කිරීමට ඒ අපරාධයේ වින්දිතයාට හෝ සාක්ෂිකරුට අවසර දෙනු ලැබිය හැකි අතර, ඒ අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ සාක්ෂිය හෝ ප්‍රකාශය අදාළ වන සියලු කාරණා සම්බන්ධයෙන් සත්‍යය ප්‍රකාශ කිරීමට ඔහු බැඳී සිටින බවට ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ "අවදානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු" යන්නට-

(අ) වයස අවුරුදු දහඅටට අඩු අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු;

(ආ) බුද්ධිමත්භාවයේ සහ සමාජ ක්‍රියාකාරීත්වයේ සැලකිය යුතු දුබලතාවයකින් පෙළෙන යම් තැනැත්තකු;

(ඇ) යම් ලිංගික වරදක වින්දිතයකු;

(ඈ) ආබාධ සහිත තැනැත්තකු;

(ඉ) දණ්ඩ නීති සංග්‍රහයේ 360ඇ වන වගන්තිය යටතේ තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වින්දිතයකු වන තැනැත්තකු හෝ 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතේ අර්ථානුකූලව ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක වින්දිතයකු වන තැනැත්තකු;

(ඊ) යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින් යම් අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට ඉල්ලීමක් කරනු ලැබ, ඔහුව අවදානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු ලෙස සලකනු ලැබිය යුතු බවට ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව සෑහීමට පත් කිරීමෙන් අනතුරුව ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් අවදානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු ලෙස තීරණය කරනු ලබන යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු; සහ

(උ) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින්, වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත, අවදානමකට ලක් විය හැකි අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු බවට නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු,

ඇතුළත් වේ.

ආරක්ෂක නිලධරයා විසින් අඛණ්ඩ අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීම සහ ආරක්ෂක වැඩපිළිවෙළ වෙනස් කිරීම

**35.** (1) මේ පනතේ විධිවිධාන යටතේ ආරක්ෂාව ලබාගෙන ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අඛණ්ඩ අවශ්‍යතා තක්සේරුවක් සිදු කරන ලෙස අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් ආරක්ෂක නිලධරයකුට නියම කරනු ලැබිය යුතු ය.

(2) යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් යොදන ලද යම් ආරක්ෂක වැඩපිළිවෙළක් වෙනස් කළ යුතු බවට යම් ආරක්ෂක නිලධරයකුගේ මතය වන අවස්ථාවක දී, ඒ ආරක්ෂක නිලධරයා විසින් ඒ ආරක්ෂක වැඩපිළිවෙළ වෙනස් කරනු ලැබිය හැකි අතර, ඒ සඳහා හේතු ද සමඟ ඒ කරුණ පිළිබඳව අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා මගින් ආරක්ෂක කොට්ඨාසය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් ආරක්ෂක වැඩපිළිවෙළක් වෙනස් කරනු ලැබිය යුතු ද යන වග තීරණය කිරීමේ දී-

(අ) අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති අවදානමේ ස්වභාවය සහ ඒ අවදානමේ ප්‍රමාණය;

(ආ) අලුත් වැඩපිළිවෙළෙහි ප්‍රායෝගික පැතිකඩ සහ ඒ සම්බන්ධයෙන් වන වියදම්; සහ

(ඇ) ඒ වෙනස් කිරීමෙන් ඇති වන අවස්ථානුගත කරුණුවල වෙනස්කම්වලට අනුවර්තනය වීම සඳහා අපරාධයේ වින්දිතයාට හෝ සාක්ෂිකරුට නැතහොත් ඔහුට සම්බන්ධතා ඇති වෙනත් යම් තැනැත්තකුට ඇති හැකියාව,

පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(4) යම් පොලිස් කොට්ඨාසයක අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සැපයීමේ හදිසි අවශ්‍යතාවයක් පවතින අවස්ථාවක දී, ඒ අපරාධයේ වින්දිතයාට හෝ සාක්ෂිකරුට ඒ හදිසි ආරක්ෂාව සැපයීමේ කාර්යය සඳහා සුදුසු යයි ආරක්ෂක නිලධරයා සලකන පරිදි වූ යම් වැඩපිළිවෙළ ඒ ආරක්ෂක නිලධරයා විසින් යෙදිය යුතු ය.

ආරක්ෂාව සැපයීම නතර කිරීම

**36.** (1) 32 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකාරිය, ආරක්ෂක කොට්ඨාසය හෝ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ආරක්ෂක නිලධරයකු විසින්, මේ පනත යටතේ යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සැපයීම-

(අ) ඒ ආරක්ෂාව තවදුරටත් ලබා දීමේ අවශ්‍යතාවයක් නොමැති කවර හෝ අවස්ථාවක; හෝ

(ආ) ඒ අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු-

(i) ඒ ආරක්ෂාව සැපයීම නතර කරන ලෙස ඉල්ලා සිටින කවර හෝ අවස්ථාවක;

(ii) ඒ ආරක්ෂාව ලබාගැනීම ප්‍රතික්ෂේප කරන කවර හෝ අවස්ථාවක;

(iii) සපයන ලද ආරක්ෂාව අනිසි ලෙස භාවිත කරන කවර හෝ අවස්ථාවක;

(iv) එකඟ වූ යම් කොන්දේසි කඩ කරන කවර හෝ අවස්ථාවක;

(v) ආරක්ෂාව ලබාගැනීම පිණිස අධිකාරිය, ආරක්ෂක කොට්ඨාසය, යම් අධිකරණයක්, කොමිෂන් සභාවක්, පොලිස් ස්ථානයක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත යම් අසත්‍ය තොරතුරක්, ප්‍රකාශයක්, පැමිණිල්ලක් හෝ සාක්ෂියක් සපයා ඇති බව සොයා ගනු ලැබූ කවර හෝ අවස්ථාවක; හෝ

(vi) මේ පනත ප්‍රකාරව යම් ආරක්ෂාවක් ලබා ගනු ලැබ, ඒ ආරක්ෂාව අඛණ්ඩව ලබාගැනීම පිණිස අධිකාරිය, ආරක්ෂක කොට්ඨාසය, යම් අධිකරණයක්, කොමිෂන් සභාවක්, පොලිස් ස්ථානයක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත අසත්‍ය තොරතුරක්, ප්‍රකාශයක්, පැමිණිල්ලක් හෝ සාක්ෂියක් සපයනු ලබන කවර හෝ අවස්ථාවක,

එය නතර කිරීමට හේතු වාර්තාගත කිරීමෙන් අනතුරුව, නතර කරනු ලැබිය හැකි ය.

(2) ආරක්ෂක කොට්ඨාසයේ ප්‍රධානියාගේ එකඟත්වය ඇතිව මිස ආරක්ෂක නිලධරයකු විසින් යම් ආරක්ෂක වැඩපිළිවෙළක් නතර නොකළ යුතු ය.

(3) තමාට ප්‍රදානය කරන ලද ආරක්ෂාව නතර කිරීමට ගත් තීරණයකින් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු අතෘප්තියට පත් වන අවස්ථාවක දී, ඔහු විසින්-

(අ) ඒ තීරණය ආරක්ෂක නිලධරයා හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් ගනු ලැබුවේ නම්, ඒ තීරණයට එරෙහිව අධිකාරිය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) ඒ තීරණය අධිකාරිය විසින් ගනු ලැබුවේ නම්, ඒ තීරණයට එරෙහිව 74 වන වගන්තිය යටතේ පත් කරන ලද උපදේශක මණ්ඩලය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

(4) අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය හෝ උපදේශක මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් කරුණු සලකා බැලීමෙන් අනතුරුව, (1) වන උපවගන්තියේ සඳහන් තීරණය සුදුසු ආකාරයකින් වෙනස් කිරීම හෝ ස්ථිර කිරීම සිදු කළ හැකි ය.

(5) මේ වගන්තිය යටතේ යම් ආරක්ෂක වැඩපිළිවෙළක් නතර කරනු ලැබිය යුතු ද යන්න තීරණය කිරීමේ දී, අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ ආරක්ෂාවට ඇති තර්ජනයේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳව විශේෂ සැලකිල්ල යොමු කරනු ලැබිය යුතු ය.

සහාය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යුතුකම්

**37.** (1) මේ පනත යටතේ යම් සහායක් හෝ ආරක්ෂාවක් ලැබී ඇති යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින්-

(අ) ඒ සහාය හෝ ආරක්ෂාව අනිසි ලෙස භාවිත නොකළ යුතු ය;

(ආ) අධිකාරිය, ආරක්ෂක කොට්ඨාසය, අධිකරණයක්, කොමිෂන් සභාවක්, පොලිස් ස්ථානයක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත යම් අසත්‍ය තොරතුරු සැපයීම සිදු නොකළ යුතු ය; හෝ

(ඇ) අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය සමඟ එකඟතාවයට පැමිණි ලිඛිත උපදෙස්වලට හෝ නියමවලට සහ කොන්දේසිවලට පටහැනිව කටයුතු සිදු නොකළ යුතු ය.

(2) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු (1) වන උපවගන්තිය උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කරන බවට විශ්වසනීය තොරතුරු ඇති අවස්ථාවක දී, අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු අතර, ඒ පරීක්ෂණයෙන් අනාවරණය වන කරුණු පිළිබඳව අධිකරණයට හෝ කොමිෂන් සභාවට දැනුම් දෙනු ලැබිය යුතු ය. අධිකරණය

හෝ කොමිෂන් සභාව විසින් වැඩිදුර පරීක්ෂණයකින් අනතුරුව, ඒ අපරාධයේ වින්දිතයාට හෝ සාක්ෂිකරුට සපයා ඇති සහායට හෝ ආරක්ෂාවට අදාළව සුදුසු නියෝගයක් කරනු ලැබිය යුතු ය.

**වින්දිතයන් සහ සාක්ෂිකරුවන් පිළිබඳ ආරක්ෂක නිලධරයා**

38. (1) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පොලිස්පතිවරයා විසින්, අධිකාරිය විමසා (මේ පනතේ "ආරක්ෂක නිලධරයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වින්දිතයන් සහ සාක්ෂිකරුවන් පිළිබඳ ආරක්ෂක නිලධරයන් ලෙස නම් කරනු ලැබිය යුතු පොලිස් නිලධරයන් අවශ්‍ය විය හැකි පරිදි වූ යම් සංඛ්‍යාවක් එක් එක් පොලිස් ස්ථානයට පත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ නිලධරයන්ගෙන් යටත් පිරිසෙයින් එක් නිලධරයකු කාන්තා පොලිස් නිලධාරිනියක් විය යුතු ය.

(2) යම් පොලිස් ස්ථානයකට පත් කරනු ලැබීමට අවශ්‍ය ආරක්ෂක නිලධරයන් සංඛ්‍යාව තීරණය කිරීමේ දී, පොලිස්පතිවරයා විසින්, පොලිස් කොට්ඨාසයේ ජනගහනය, දරුණු අපරාධ පැවතීම සහ ඒ පොලිස් කොට්ඨාසය තුළ සිටින ළමුන්, කාන්තාවන් හෝ ආබාධිත තැනැත්තන් ඇතුළුව විශේෂ පුද්ගල කාණ්ඩවල අනුමාන කළ හැකි අවදානමට ලක්විය හැකි බව මෙන්ම ඒ පොලිස් කොට්ඨාසය සම්බන්ධයෙන් වන වෙනත් අදාළ දත්ත හා සංඛ්‍යා ලේඛන සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) (අ) අධිකාරිය විමසා, ආරක්ෂක කොට්ඨාසයේ ප්‍රධානියා විසින්, ආරක්ෂක නිලධරයන් ඔවුන්ගේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු අතර, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද ඒ මාර්ගෝපදේශ අවශ්‍ය අවස්ථාවල දී රහස්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) අධිකාරිය විසින් ආරක්ෂක නිලධරයන්ගේ නිපුණතාව වර්ධනය කිරීමේ කාර්යය සඳහා විශේෂ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිය යුතු ය.

(4) ආරක්ෂක නිලධරයකු විසින් මේ පනත යටතේ අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සැපයීමේ දී ඔහු ගන්නා සෑම ක්‍රියාමාර්ගයක් ම පිළිබඳව රහස්‍ය වාර්තාවක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

## V වන කොටස

## අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය පිහිටුවීම

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය

**39.** (1) (මේ පනතේ "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය

**40.** (1) අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(අ) මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් කෙරෙහි ගරුත්වය සහ පිළිගැනීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) මේ පනතේ විධිවිධාන සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය කරන ලදැයි හෝ අහිමි කරන ලදැයි නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්නව ඇතැයි යන්න පිළිබඳව අධිකාරිය වෙත ලැබුණු යම් පැමිණිල්ලක් හෝ තොරතුරු විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම සහ මේ පනතේ විධිවිධාන සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහතික කරනු ලබන-

(i) නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලෙසට යම් තැනැත්තකුට හෝ අධිකාරියකට විධාන කිරීම හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ii) යම් මූල්‍ය හෝ වෙනත් සහාය ප්‍රදානය කිරීම; හෝ

(iii) වෙනත් යම් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම;

(ඇ) අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර, උපදේශන සේවා හෝ පුනරුත්ථාපන සේවා හෝ හානිපූර්ණ හෝ ප්‍රතිෂ්ඨාපන ක්‍රියාමාර්ග ගැනීම හෝ ගැනීමට කටයුතු සැලසීම මගින් අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

(ඈ) මේ පනත යටතේ පිහිටුවන ලද ආරක්ෂණ අරමුදලෙන් අපරාධයක වින්දිතයන්ට යම් තාවකාලික ප්‍රදාන ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා යෝජනා ක්‍රමයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම සහ මේ පනතේ 69 වන වගන්තිය යටතේ උපදේශක මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන පරිදි ඒ අපරාධයක වින්දිතයන්ට තාවකාලික ප්‍රදාන ප්‍රදානය කිරීම;

(ඉ) මේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව මෙන්ම ඔවුන්ට මේ පනත යටතේ ලබාගත හැකි සහන හෝ ප්‍රතිකර්ම පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම;

(ඊ) මේ පනත මගින් විධිවිධාන සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් බලාත්මක කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුවට, වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවකට, ව්‍යවස්ථාපිත ආයතනයකට සහ රජයේ නිලධරයන්ට උපදෙස් දීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම;

(උ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අදාළව පවත්නා නීති සහ අදාළ ආයතන විසින් පිළිගනු ලැබ ඇති සහ අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති,

පරිචයන් හෝ කාර්යපටිපාටි සමාලෝචනය කිරීම සහ ඒ නීති, ප්‍රතිපත්ති, පරිචයන් හෝ කාර්යපටිපාටි අදාළ නවතම පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට සහ යහපත් පරිචයන්ට අනුකූල වන බව තහවුරු කිරීම සඳහා ඒවා සංශෝධනය කිරීමට හෝ යාවත්කාලීන කිරීමට යම් නිර්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය වෙතොත් ඒ නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඌ) යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින් ඉල්ලීමක් කිරීමේ දී, අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ සාක්ෂියක් හෝ ප්‍රකාශයක් දුරස්ථ ස්ථානයක සිට වාර්තාගත කිරීම සඳහා සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් පිහිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම;

(එ) වෙනත් අදාළ අධිකාරීන් විමසා, අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ උපරිම යහපත සහතික කරනු ලබන මාර්ගෝපදේශ සහ කාර්යපටිපාටි සංවර්ධනය කිරීම සහ නිකුත් කිරීම;

(ඒ) ආරක්ෂක කොට්ඨාසයේ ස්වාධීන ක්‍රියාකාරීත්වයට අදාළව මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(ඔ) (i) යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අවශ්‍යතා පිළිබඳව; හෝ

(ii) අධිකාරිය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් විශේෂ කාණ්ඩයකට අයත් අපරාධයක වින්දිතයන්ගේ හෝ සාක්ෂිකරුවන්ගේ යම් විශේෂ අවශ්‍යතා පිළිබඳව,

රජයේ වෛද්‍ය නිලධරයන්, ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන් හෝ පරිවාස හා සමාජ සේවාවලට සම්බන්ධ රජයේ නිලධරයන් ඇතුළුව රජයේ නිලධරයන් සංවේදීකරණය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම;

(ඕ) (i) අපරාධ සිදු වීම අඩු කළ හැකි;

(ii) නිශ්චිත අපරාධවලින් වින්දිතයන් හට සිදුවන බලපෑම අවම කළ හැකි හෝ වැළැක්විය හැකි;

(iii) අපරාධයක වින්දිතයන්ට ඵලදායී ලෙස ප්‍රතිකාර කළ හැකි, ඔවුන් පුනරුත්ථාපනය කරනු ලැබිය හැකි, ඔවුන්ට උපදේශනය දිය හැකි, සහාය දිය හැකි, වන්දි ගෙවිය හැකි සහ ඔවුන් ආරක්ෂා කරනු ලැබිය හැකි;

(iv) පවත්නා අපරාධ යුක්ති යාන්ත්‍රණ හරහා අපරාධයක වින්දිතයන් හෝ සාක්ෂිකරුවන් ප්‍රතිකර්ම හෝ සහන ලබා ගැනීම වළක්වනු ලබන හේතු හඳුනා ගත හැකි සහ ඉවත් කළ හැකි; සහ

(v) නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් ඉදිරියෙහි ප්‍රකාශ සිදු කිරීමට හෝ යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි වූ යම් නඩු කටයුතුවල දී බියෙන් තොරව සාක්ෂි දීමට සාක්ෂිකරුවන්ට උපකාරී වන පරිසරයක් නිර්මාණය කළ හැකි,

මාර්ග සහ ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම හෝ ඒ පර්යේෂණ පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම;

(ක) ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන් සහ රජයේ සමාජ සේවා ආයතනවල නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමෙහි යෙදී සිටින අධිකරණ, කොමිෂන් සභා, වෙනත් යම් විනිශ්චය සභා, රජයේ නිලධරයන් සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවා නියුක්තයන් විසින් අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ චර්යා සංග්‍රහ සහ පිළිගත් ප්‍රතිමාන හා යහපත් පරිචයන් අදාළ කර ගැනීම සහ පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම;

(ග) (i) වින්දිතභාවයට පත්වීමේ සිදුවීම් අවම කිරීම පිණිස අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති;

(ii) අපරාධවල වින්දිතයන් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ක්‍රියාමාර්ග; සහ

(iii) දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන් ප්‍රතිෂ්ඨාපන යුක්ති ක්‍රියාමාර්ග,

සංවර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ආණ්ඩුවට සහ වෙනත් සුදුසු අධිකාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ච) පවතින මුදල් රෙගුලාසි සැලකිල්ලට ගනිමින්, අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට මූල්‍ය සහාය ප්‍රදානය කිරීම සඳහා වන කාර්ය පටිපාටිය සහ නිර්ණායක නියම කිරීම;

(ජ) අපරාධයක ළමා වින්දිතයන්ට හෝ ළමා සාක්ෂිකරුවන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ ඒ අපරාධයක ළමා වින්දිතයන්ගේ හෝ ළමා සාක්ෂිකරුවන්ගේ යම් විශේෂ අවශ්‍යතා සුරක්ෂිත කිරීමට සහ සම්පූර්ණ කිරීමට සේවානියුක්ත කරනු ලැබිය හැකි සුදුසුකම් සහිත තැනැත්තන් සහ ක්‍රියාත්මක කළ හැකි විධිමත් කාර්ය පටිපාටි හඳුනා ගැනීම;

(ට) අපරාධ යුක්ති පද්ධතිය තුළ දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන්, අපරාධයක වින්දිතයන් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම; සහ

(ඩ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීම හෝ කිරීම.

(2) අධිකාරිය විසින් යම් තැනැත්තකු හෝ යම් අධිකාරියක් වෙත යම් විධානයක් නිකුත් කරනු ලබන හෝ යම් නිර්දේශයක් කරනු

ලබන අවස්ථාවක දී, නැතහොත් (1) වන උපවගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස යම් තැනැත්තකුට හෝ යම් අධිකාරියකට නියම කරනු ලබන අවස්ථාවක දී-

(අ) ඒ විධානය හෝ ඒ නිර්දේශය බලාත්මක කිරීම හෝ ඒ ක්‍රියාමාර්ගය ගැනීම සිදු කොට ඒ කරුණ පිළිබඳව අධිකාරිය වෙත ආපසු වාර්තා කිරීම; හෝ

(ආ) ඒ විධානය හෝ නිර්දේශය බලාත්මක කිරීමට හෝ ඒ ක්‍රියාමාර්ගය ගැනීමට ඒ තැනැත්තාට හෝ ඒ අධිකාරියට නොහැකි වන අවස්ථාවක දී, ඒ සඳහා හේතු ඉදිරිපත් කරමින් ඒ නොහැකි වීම පිළිබඳව අධිකාරිය වෙත ආපසු වාර්තා කිරීම,

ඒ තැනැත්තාගේ හෝ ඒ අධිකාරියේ කාර්යය විය යුතු ය.

(3) අධිකාරිය විසින් ඒ තැනැත්තාගෙන්, ඒ අධිකාරියෙන් හෝ වෙනත් යම් අදාළ අධිකාරියකින් කාලීනව වාර්තා කැඳවීම මගින් (2) වන උපවගන්තියේ සඳහන් විධානය හෝ නිර්දේශය ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාමාර්ගය ගැනීම පිළිබඳව අධීක්ෂණය කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ බලතල

**41.** (1) අධිකාරියට පහත දැක්වෙන බලතල තිබිය යුතු යː-

(අ) මේ පනත යටතේ අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කරන ලදැයි හෝ අහිමි කරන ලදැයි නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්නව ඇතැයි වන යම් පැමිණිල්ලක් හෝ තොරතුරක් ලබා ගැනීම;

(ආ) මේ පනත යටතේ අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කරනු ලැබීමක් හෝ අහිමි කරනු ලැබීමක් නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්න වීමක් පිළිබඳව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය සඳහා-

(i) අධිකරණ නිලධරයකු හෝ කොමිෂන් සභාවක කොමසාරිස්වරයකු නොවන යම් තැනැත්තකුට,

අධිකාරිය ඉදිරියට පැමිණෙන ලෙස සහ ඒ විමර්ශනයට හෝ පරීක්ෂණයට සහභාගී වන ලෙස නියම කිරීම;

(ii) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් නොවන යම් තැනැත්තකුට, පරීක්ෂා කිරීම සහ පිටපත් ගැනීම සඳහා යම් විමර්ශන වාර්තාවක් හෝ පරීක්ෂණ වාර්තාවක්, තොරතුරු සටහන් පොතක උධෘතයක් සහ පොලිස් නිලධරයන්ගේ හමුවීම් පොතේ උද්ධෘතයක් ද ඇතුළුව ඒ තැනැත්තාගේ සන්තකයේ හෝ භාරයේ තිබෙන යම් ලේඛනයක්, යම් ලේඛනයක සහතික කළ පිටපතක් හෝ වෙනත් යම් දෙයක් අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමට නියම කිරීම;

(iii) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් නොවන යම් තැනැත්තකුට, ඒ තැනැත්තා සන්තකයේ ඇති යම් තොරතුරක් ලිඛිතව අධිකාරිය වෙත සැපයීමට නියම කිරීම:

එසේ වුව ද, යම් තොරතුරක් අනාවරණය කිරීම ජාතික ආරක්ෂාවට හානිකර වන්නේ නම්, ඒ තැනැත්තා ඒ තොරතුර සැපයීම අවශ්‍ය නොවන අතර, ඒ තොරතුර රහස්‍ය බව ඔප්පු කිරීමේ භාරය එසේ කියා සිටින තැනැත්තා වෙත පැවතිය යුතු ය;

(iv) අධිකරණ නිලධරයකු හෝ කොමිෂන් සභාවක කොමසාරිස්වරයකු නොවන යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කොට ඒ තැනැත්තාගේ ප්‍රකාශයක් වාර්තා කිරීමඃ

එසේ වුව ද, ඒ ප්‍රකාශය වාර්තා කරන අතරතුර දී ප්‍රකාශ කරන ලද යම් දෙයක්, යම් වරදකට අදාළව යම් චෝදනාවක් හෝ අධිචෝදනාවක් පිළිබඳව වූ යම් පසු නඩු විභාගයක දී ඒ තැනැත්තාට එරෙහිව භාවිත නො කරනු ලැබිය යුතු ය;

(v) අදාළ ඉල්ලීම සාධාරණීකරණය කෙරෙන පරිදි ප්‍රමාණවත් කරුණු සපයනු ලබන්නේ නම්, අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට එරෙහිව සිදු කරන ලදැයි කියනු ලබන යම් වරදකට අදාළව හෝ සිදු කරන ලදැයි කියනු ලබන අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කිරීමකට හෝ අහිමි කිරීමකට අදාළව නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්න වීමකට අදාළව යම් අධිකරණයක හෝ කොමිෂන් සභාවක වාර්තාවල ගොනු කරන ලද යම් නඩු කටයුතුවල, ලේඛනවල සහ වෙනත් දෙයක සහතික කළ පිටපත් යම් ගාස්තුවක් ගෙවීමෙන් තොරව අධිකාරිය වෙත සපයන ලෙස ඒ අධිකරණයෙන් හෝ කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කිරීම; සහ

(vi) අදාළ අධිකාරීන්වල පූර්ව අනුමතයට යටත්ව, යම් ස්ථානයකට හෝ පිහිටීමකට ඇතුළුවීම, සෝදිසි කිරීම හෝ පරීක්ෂා කිරීම හෝ විමර්ශනයක්, පරීක්ෂණයක්, නඩු විභාගයක් හෝ වෙනත් නඩු කටයුත්තක් ඇතුළුව, යම් ස්ථානයක කෙරීගෙන යන යම් කටයුත්තක් හෝ ක්‍රියාවලියක් නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම;

(ඇ) යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සහන සැපයීමේ කාර්යය සඳහා-

(i) මේ පනත යටතේ යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ හෝ හිමිකම් අහිමි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ යම් අලාභයක් සඳහා ප්‍රතිකර්ම යෙදීමට හෝ සහන සැලසීමට හෝ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සුදුසු නියෝගයක් කිරීම;

(ii) මේ පනත යටතේ යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම හෝ ආරක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අදාළ අධිකාරීන් වෙත විධාන කිරීම, උපදෙස් දීම හෝ නිර්දේශ කිරීම; සහ

(iii) පවත්නා වෙනත් නෛතික යාන්ත්‍රණවලට අමතරව සමථකරණය සහ බේරුම්කරණය ඇතුළු යාන්ත්‍රණ භාවිත කිරීම;

(ඇ) මේ පනත යටතේ සිදු කරනු ලදැයි කියනු ලබන යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කිරීම හෝ අහිමි කිරීම නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්න වීම පිළිබඳව වන යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් මත පදනම්ව නීතිපතිවරයා වෙත හෝ වෙනත් යම් අධිකාරියක් වෙත නියෝජනයන් සිදු කිරීම;

(ඉ) මේ පනත යටතේ වන යම් වරදක් පිළිබඳව වූ විමර්ශනයක් හෝ පරීක්ෂණයක් 56 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) වන ඡේදය යටතේ, තමා වෙත පවරා ගන්නා ලෙස ආරක්ෂක කොට්ඨාසයට විධාන කිරීම;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, කුලියට හෝ බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම;

(උ) එහි කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ඌ) ආරක්ෂණ අරමුදලේ බැරට ඇති මුදල්, සුදුසු සහ ආරක්ෂිත ආකාරයකින් ආයෝජනය කිරීම සහ බැංකුවල ජංගම, ඉතිරිකිරීමේ සහ තැන්පතු ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාම;

(එ) අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය විය හැකි එහි නිලධරයන් සහ වෙනත් සේවකයන්, විශේෂඥ උපදේශකවරුන් සහ උපදේශකවරුන් පත් කිරීම, ඉවත් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලන කටයුතු සිදු කිරීම;

(ඒ) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව වූ යම් මූලාශ්‍රයකින් පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ සහ ප්‍රදාන පිළිගැනීම හා ලබා ගැනීම සහ එහි කාර්ය හා කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සහ කිරීම සඳහා ඒවා භාවිත කිරීම; සහ

(ඔ) මේ පනත යටතේ අධිකාරියේ කාර්ය හා කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු දේ කිරීම.

(2) අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සහාය හෝ ආරක්ෂාව සැපයීමේ දී, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමතය නොමැතිව, යම් විදේශ රජයකින් හෝ විදේශ හෝ ජාත්‍යන්තර සංවිධානයකින් යම් සහායක් ලබා නොගත යුතු ය.

(3) සාධාරණ හේතුවක් නොමැතිව, මේ වගන්තිය යටතේ අධිකාරිය වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී අධිකාරිය විසින් කරන ලද හෝ නිකුත් කරන ලද යම් නියමයකට, විධානයකට හෝ නියෝගයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය

**42.** (1) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයකට පැවරිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා, මේ පනත මගින් අධිකාරිය වෙත පවරනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම සිදු කළ යුතු ය.

(3) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යඃ-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන්ඃ-

(i) අධිකරණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කරන ලද ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(ii) පොලිස් දෙපාර්තමේන්තුව පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කරන ලද ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(iii) කාන්තා කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කරන ලද ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(iv) ළමයින් පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කරන ලද ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(v) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නම් කරන ලද ඒ සභාවේ සාමාජිකයකු;

(vi) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනත මගින් පිහිටුවන ලද නීති ආධාර කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ ඒ සභාපතිවරයා විසින් නම් කරන ලද කොමසාරිස් ධුරයට වඩා පහළ නොවන ධුරයක නාමිකයකු;

(vii) බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා හෝ ඒ කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරන ලද කොමසාරිස් ධුරයට වඩා පහළ නොවන ධුරයක නාමිකයකු;

(viii) නීතිපතිවරයාගේ නාමිකයකු; සහ

(ix) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධුරය දරන, පොලිස්පතිවරයාගේ නාමිකයකුඃ

එසේ වුව ද, මේ ඡේදයේ (i) වන, (ii) වන, (iii) වන හෝ (iv) වන අනුඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති විෂයයන් දෙකක් හෝ වැඩි ගණනක් එක් අමාත්‍යාංශයකට පවරනු ලැබ ඇති අවස්ථාවක දී, අධිකාරියට ඒ අමාත්‍යාංශයේ සාමාජිකයකු නම් කිරීම ඒ විෂයයන් පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) නීතිය, අපරාධවේදය, මානව හිමිකම් හෝ වෛද්‍ය විද්‍යාව යන ක්ෂේත්‍රයක අධ්‍යාපනික හෝ වෘත්තීමය සුදුසුකම්ලත් සහ ඒ ක්ෂේත්‍රයක හෝ සමාජ සේවා කටයුතුවල හෝ සිවිල් සමාජ කටයුතුවල පළපුරුද්දක් ඇති ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන (මේ පනතේ "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් පස්දෙනකු.

**43.** (1) ජනාධිපතිවරයා විසින් මණ්ඩලයේ එක් සමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු අතර, ඔහු අධිකාරියේ සභාපතිවරයා ද විය යුතු ය. අධිකාරියේ සභාපතිවරයා

(2) අධිකාරියේ සභාපතිවරයා අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු අතර, නැවත පත් කිරීම සඳහා ඔහු සුදුසුකම් ලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් අධිකාරියේ සභාපතිවරයාට ඕනෑම අවස්ථාවක දී සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගැනීමෙන් පසු බලපවත්වනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ සභාපතිවරයාට, අසනීපයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(5) ජනාධිපතිවරයා විසින් හේතු දක්වා අධිකාරියේ සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්

**44.** යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම නතර වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ, සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම

**45.** (1) ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගැනීමෙන් පසු බලපවත්වනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින් හේතු දක්වා මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ සාමාජිකයා ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට සහ ඉන්පසුව ධුරය දැරීම නතර කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 42 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත් කළ සාමාජිකයා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට අසනීපයක්, අශක්නුතාවක් හෝ මාස තුනකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම යන හේතුවක් මත තාවකාලිකව සිය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඒ සාමාජිකයා විසින් ඒ නොහැකියාව පිළිබඳව ජනාධිපතිවරයාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. එවිට, ජනාධිපතිවරයා විසින් 42 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ කාලය තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

පත් කළ සාමාජිකයකුගේ ධුර කාලය

**46.** මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් ඒ සාමාජිකයාගේ ධුරය හිස්කරන්නේ නම් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම

**47.** මණ්ඩලයේ සාමාජිකයන්ට, ජනාධිපතිවරයා විසින් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ මත වන යම් පාරිශ්‍රමික අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ රැස්වීම්

**48.** (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය. ඒ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගෙන් එක් අයකු තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(3) සභාපතිවරයා හෝ මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දරන සාමාජිකයා විසින් මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලය විසින් තීරණය කිරීම සඳහා වන සියලු කාරණා පිළිබඳව මණ්ඩලයේ රැස්වීමක දී කටයුතු කරනු ලැබිය යුතු අතර, පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතරය විසින් ඒ පිළිබඳව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ රැස්වීමක දී සැලකිල්ලට ගනු ලබන යම් කාරණයක් සඳහා වන ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට ඔහුගේ මුල් ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන් යම් ක්‍රියාවක් නිර්බල නොවන බව

**49.** මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් නිර්බල වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

**50.** (1) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය. අධිකාරියේ මුද්‍රාව

(2) අධිකාරියේ මුද්‍රාව කලින් කල මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් තැනැත්තකු භාරයේ තබනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලයේ අනුමතය ඇතිව සහ තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතබනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබන ලද සාධනපත්‍රවල සහ ලේඛනවල රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

VI වන කොටස

## අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

**51.** (1) නීතිය, පරිපාලනය හෝ අපරාධ විද්‍යාව යන ක්ෂේත්‍රයක වෘත්තීමය සුදුසුකම් ඇති සහ ඒ යම් ක්ෂේත්‍රයක යටත් පිරිසෙයින් අවුරුදු පහළොවක පළපුරුද්ද ඇති තැනැත්තකු විය යුතු (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටිය යුතු ය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

(2) මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතු අතර, ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට සහ මණ්ඩලයේ අධීක්ෂණයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වයා විසින්-

(අ) කාර්ය මණ්ඩලය පරිපාලනය කිරීම සහ පාලනය කිරීම ඇතුළුව, අධිකාරියේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය භාරව සිටිය යුතු ය; සහ

(ආ) මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලබන සියලු කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සහ කිරීම සඳහා වගකිව යුතු ය.

(4) (අ) මණ්ඩලය විසින් අධිකාරියේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ලිඛිතව සහ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අධිකාරියේ නමින් සහ අධිකාරිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) වන ඡේදය යටතේ කරන ලද යම් පැවරීමක් නොතකා, මණ්ඩලය විසින් එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය එය විසින් ම ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ හැකි අතර, මණ්ඩලය විසින් ඕනෑම අවස්ථාවක දී ඒ පැවරීම අහෝසි කරනු ලැබිය හැකි ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව, එසේ කිරීම අවශ්‍ය යයි ඔහු සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී ඔහුගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් අධිකාරියේ යම් නිලධරයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා විසින් ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට යටත්ව ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය යුතු ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුර කාලය පත් වීමේ දින සිට අවුරුදු තුනක් විය යුතු අතර, (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත්කිරීම සඳහා ඔහු සුදුසුකම් ලැබිය යුතු ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයා-

(අ) ඔහුට අයත් කාර්ය ඉටු කිරීමට ස්ථිරව ම නොහැකි තත්ත්වයට පත් වුවහොත්;

(ආ) මණ්ඩලයේ මතය අනුව යම් වංචනික හෝ නීති විරෝධී ස්වභාවයෙන් යුතු ක්‍රියාවක් හෝ අධිකාරියේ යහපතට අගතියක් වන ක්‍රියාවක් සිදු කළහොත්; හෝ

(ඇ) මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්,

මණ්ඩලය විසින්, ඊට හේතු දක්වා අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය දරනු ලබන තැනැත්තා මියයාම, (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා මණ්ඩලය අමතා යවන ලිපියක් මගින් ඉල්ලා අස්වීම මත අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය හිස් විය යුතු ය.

(9) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය හිස් වන අවස්ථාවක දී, මණ්ඩලය විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ ධුරය සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(10) මණ්ඩලයේ සාමාජිකයකු ස්ථිරව හෝ තාවකාලිකව, අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබීමට සුදුසුකම් නොලැබිය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය

**52.** (1) අධිකාරිය විසින් එහි කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් යම් සංඛ්‍යාවක් අධිකාරියේ කාර්ය මණ්ඩලය ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ අධිකාරියට පත් කරන ලද නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තයන් සම්බන්ධයෙන්-

(අ) ඒ නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි නිශ්චය කිරීම;

(ආ) ආණ්ඩුවේ අදාළ මාර්ගෝපදේශවලට අනුව ඒ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අනුප්‍රමාණ නිශ්චය කිරීම;

(ඇ) ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ඔවුන් සේවයෙන් ඉවත් කිරීම; සහ

(ඈ) ඒ නිලධරයන්ගේ හෝ සේවානියුක්තයන්ගේ ප්‍රතිලාභය පිණිස කාර්ය මණ්ඩල සුබසාධන සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිහිටුවීම සහ ඒ යම් යෝජනා ක්‍රමවලට දායකත්වය ලබා දීම,

කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලය විසින් (2) වන උපවගන්තියේ සඳහන් සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ දරන ලද යම් පෙර තනතුරකින් ඉවත් කරන ලද යම් තැනැත්තකු අධිකාරිය විසින්, අධිකාරියේ නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු ලෙස පත් නොකරනු ලැබිය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

**53.** (1) අධිකාරියේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ ද, ඒ නිලධරයා සේවයේ නියුක්ත කර ඇත්තේ යම් අමාත්‍යාංශයක් විසින් හෝ අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික

ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

VII වන කොටස

**අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය**

අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම

**54.** (1) මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් විමර්ශන හෝ පරීක්ෂණ පැවැත්වීමේ සහ මේ පනත යටතේ අපරාධ වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැපයීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ පොලිස් නිලධරයන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මේ පනතේ "ආරක්ෂක කොට්ඨාසය" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) පොලිස්පතිවරයා විසින් අධිකාරිය විමසා, (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබිය යුතු පොලිස් නිලධරයන් නම් කරනු ලැබිය යුතු ය.

(3) පොලිස්පතිවරයා විසින් අධිකාරිය විමසා, ආරක්ෂක කොට්ඨාසයට පොලිස් නිලධරයන් තෝරා ගැනීම සඳහා වන නිර්ණායක තීරණය කරනු ලැබිය යුතු අතර, ඒ නිර්ණායක ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) පොලිස්පතිවරයා විසින් අධිකාරියේ එකඟත්වය ඇතිව, නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට පහළ නොවන නිලයක සිටින උචිත සුදුසුකම් සහිත පොලිස් නිලධරයකු ආරක්ෂක කොට්ඨාසයේ ප්‍රධානියා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(5) ආරක්ෂක කොට්ඨාසයේ පොලිස් නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් ඉවත් කිරීම සම්බන්ධ සියලු කාරණා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පොලිස්පතිවරයාගේ විෂය පථය යටතේ විය යුතු ය. ඒ යම් කාරණයක් සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් අධිකාරියේ අදහස් විමසිය හැකි ය.

(6) (අ) අධිකාරිය විසින් ආරක්ෂක කොට්ඨාසයේ කටයුතුවල රහස්‍යභාවය සහතික කිරීම සඳහා සහ මේ පනත යටතේ ආරක්ෂක කොට්ඨාසයේ පොලිස් නිලධරයන් ඔවුන්ගේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ කිරීමේ දී ඒ පොලිස් නිලධරයන්ගේ අපක්ෂපාතීබව සහ වගවිය යුතුබව සහතික කිරීම සඳහා රීති සාදනු ලැබිය යුතු ය.

(ආ) ආරක්ෂක කොට්ඨාසයට පත් කරන ලද සෑම පොලිස් නිලධරයකු ම ඒ රීති අනුගමනය කිරීම සඳහා ලිඛිතව පොරොන්දු විය යුතු ය.

(7) (අ) ආරක්ෂක කොට්ඨාසයේ යම් පොලිස් නිලධරයකු විසින් සිදු කරන ලද, මේ පනතේ යම් අදාළ විධිවිධානයකට හෝ (6) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ අධිකාරිය විසින් සාදන ලද යම් රීතියකට යම් චේතනාන්විතව අනුකූල නොවීමක් සම්බන්ධයෙන් වන යම් පැමිණිල්ලක් අධිකාරිය විසින් පොලිස්පතිවරයාට යොමු කළ යුතු අතර, පොලිස්පතිවරයා විසින් ඒ පැමිණිල්ල පිළිබඳව පරීක්ෂණයක් සිදු කර අදාළ අවස්ථානුගත කරුණු අනුව සුදුසු යයි සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

(ආ) ආරක්ෂක කොට්ඨාසයේ පොලිස් නිලධරයකු ඒ යම් විධිවිධානයක් හෝ රීතියක් කඩකර ඇති බව සඳහන් කරමින් අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතිකයක් ඒ පොලිස් නිලධරයාට එරෙහිව යම් නඩුවක් හෝ පරීක්ෂණයක් ආරම්භ කිරීමේ කාර්යය සඳහා බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

ආරක්ෂක කොට්ඨාසයට දීපව්‍යාප්ත බලය ඇති බව

**55.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ පනතේ III වන කොටස යටතේ වූ වරදකට අදාළව-

(අ) ආරක්ෂක කොට්ඨාසයට සෘජුව ම කරන ලද;

(ආ) අධිකාරියට කරන ලදුව, ආරක්ෂක කොට්ඨාසය වෙත යොමු කරන ලද; හෝ

(ඇ) යම් අධිකරණයක්, කොමිෂන් සභාවක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් ආරක්ෂක කොට්ඨාසය වෙත යොමු කරන ලද,

යම් පැමිණිල්ලක් ලබා ගැනීමට, ඒ පිළිබඳව විමර්ශනයක් කිරීමට හෝ පරීක්ෂණයක් කිරීමට ආරක්ෂක කොට්ඨාසයට දීපව්‍යාප්ත බලය තිබිය යුතු ය.

(2) යම් පොලිස් ස්ථානයකට අනුයුක්ත කර ඇති සෑම පොලිස් නිලධරයකු විසින් ම ආරක්ෂක කොට්ඨාසය ඉල්ලා සිටින කවර හෝ අවස්ථාවක දී, ආරක්ෂක කොට්ඨාසයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී ආරක්ෂක කොට්ඨාසය වෙත සහාය දක්වනු ලැබිය යුතු ය.

ආරක්ෂක කොට්ඨාසයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**56.** (1) ආරක්ෂක කොට්ඨාසයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(අ) මේ පනතේ විධිවිධාන යටතේ ආරක්ෂක කොට්ඨාසය වෙත ලැබෙන හෝ අධිකාරිය, යම් අධිකරණයක්, කොමිෂන් සභාවක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් ආරක්ෂක කොට්ඨාසය වෙත යොමු කරනු ලබන පැමිණිලි විමර්ශනය කිරීම හෝ පරීක්ෂණය කිරීම;

(ආ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැපයීම;

(ඇ) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු 59 වන වගන්තියේ සඳහන් විශේෂිත වැඩසටහනකට ඇතුළත් කර ගැනීම සඳහා වන කොන්දේසි පැනවීම;

(ඈ) යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට අත්‍යාසන්න තර්ජනයක් ඇති අවස්ථාවක දී, ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට වහාම ආරක්ෂාව සැපයීම;

(ඉ) යම් පොලිස් ස්ථානයක් මගින් මේ පනත යටතේ වරදක් පිළිබඳව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට අදාළව ඒ පොලිස් ස්ථානය විසින් කරන ලද ඉල්ලීමක් මත අවශ්‍ය මගපෙන්වීම සහ උපදෙස් සැපයීම;

(ඊ) අවස්ථානුගත කරුණුවල බැරෑරුම්කම සහ බරපතළ බව මත පදනම්ව අධිකාරිය විසින් නිකුත් කරන ලද විධානයක් ලැබීම මත, යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට එරෙහිව සිදු කරන ලද මේ පනත යටතේ වූ යම් වරදක් පිළිබඳ යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීම ආරක්ෂක කොට්ඨාසය යටතට ගැනීම; සහ

(උ) මේ පනත යටතේ සිදු කර ඇතැයි කියනු ලබන යම් වරදක බැරෑරුම්කම සහ බරපතළ බව අනුව ඒ වරද පිළිබඳව විමර්ශනය හෝ පරීක්ෂණය පැවැත්වීමේ දී ආරක්ෂක කොට්ඨාසයේ මැදිහත් වීම සාධාරණීකරණය කෙරෙන බවට ආරක්ෂක කොට්ඨාසයේ මතය වන අවස්ථාවක දී, අධිකාරියේ එකඟත්වය ඇතිව ඒ විමර්ශනය හෝ පරීක්ෂණය පැවැත්වීම ආරක්ෂක කොට්ඨාසය යටතට ගැනීම.

(2) ආරක්ෂක කොට්ඨාසයට අනුයුක්ත නිලධරයන් අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට අදාළ කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු අතර, නීතිය මගින් නියම කර ඇති ආකාරයට හැර ඒ කාරණා පිළිබඳව යම් තොරතුරක් හුවමාරු නොකරනු ලැබිය යුතු ය.

VIII වන කොටස

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සඳහා වන සහායක සහ ආරක්ෂක වැඩසටහන**

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සඳහා වන සහායක සහ ආරක්ෂක පොදු වැඩසටහන

**57.** (1) අධිකාරිය විසින්, ආරක්ෂක කොට්ඨාසය විමසා සහ අධිකාරිය විසින් සාදනු ලැබිය යුතු මාර්ගෝපදේශ මත පදනම්ව, අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැපයීම සඳහා වන කාර්ය පටිපාටිය ඇතුළත් කරමින් (මේ පනතේ "පොදු වැඩසටහන" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සඳහා වන සහායක සහ ආරක්ෂක පොදු වැඩසටහනක් සැලසුම් කරනු ලැබිය යුතු ය.

(2) පොදු වැඩසටහන සඳහා මාර්ගෝපදේශ සෑදීමේ දී, අධිකාරිය විසින් අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව ප්‍රදානය කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රතිමාන, ප්‍රමිති, ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ යහපත් පරිචයන් නිසි ලෙස සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

*පොදු වැඩසටහන පිළිබඳව තොරතුරු හුවමාරු කිරීම අධිකාරියේ කාර්යය විය යුතු බව*

**58.** (1) අධිකාරිය විසින්-

(අ) පොදු වැඩසටහන පිළිබඳව මහජනතාව අතර තොරතුරු හුවමාරු කළ යුතු ය;

(ආ) (i) මේ පනතේ III වන කොටසේ නිශ්චිතව දක්වා ඇති යම් වරදක් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් කරනු ලබන ඕනෑම අවස්ථාවක සහාය සහ ආරක්ෂාව ඉල්ලා සිටීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය;

(ii) පොදු වැඩසටහන යටතේ අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු සඳහා සහාය සහ ආරක්ෂාව ලබාගැනීමේ කාර්යය සඳහා යම් අදාළ අධිකාරියක් ප්‍රමාදයකින් තොරව සම්බන්ධ කර ගනු ලැබීමට පවතින ක්‍රම; සහ

(iii) පොදු වැඩසටහන යටතේ ඉල්ලා සිටිය හැකි සහායේ සහ ආරක්ෂාවේ ස්වභාවය,

ද ඇතුළත්ව පොදු වැඩසටහන පිළිබඳව මහජනතාව දැනුම්වත් කළ යුතු ය.

(2) (අ) අධිකාරිය විසින් (1) වන උපවගන්තියේ සඳහන් පොදු වැඩසටහන අන්තර්ගත වන අත්පොතක් සකස් කරනු ලැබිය යුතු අතර, ඒ අත්පොත අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැපයීමේ කාර්යය පැවරී ඇති අදාළ සියලු තැනැත්තන්ට, අධිකාරීන්ට සහ ආයතනවලට ලබාගැනීමට හැකි වීම සහතික කරනු ලැබිය යුතු ය.

(ආ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැපයීමේ දී පොදු වැඩසටහන සම්බන්ධයෙන් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීම පොදු වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති සෑම තැනැත්තකුගේ ම, අධිකාරියක ම හෝ ආයතනයක ම කාර්යය විය යුතු ය.

අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් විශේෂිත වැඩසටහනක් යොදා ගනීම

**59.** (1) අධිකාරිය විසින් සැලසුම් කරන ලද පොදු වැඩසටහන සහ අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව, ආරක්ෂක කොට්ඨාසය විසින්, යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සහාය සහ ආරක්ෂාව සැපයීමේ කාර්යය සඳහා (මේ පනතේ "විශේෂිත වැඩසටහන" යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂිත වැඩසටහනක් යොදා ගනු ලැබිය යුතු ය.

(2) ආරක්ෂක කොට්ඨාසය මගින්-

(අ) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත;

(ආ) අධිකාරිය විසින් කරනු ලබන නිර්දේශයක් මත;

(ඇ) යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ රජයේ නිලධරයකු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් මත; හෝ

(ඈ) අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් ලැබුණු නිවේදනයක් මත,

අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විශේෂිත වැඩසටහනකට ඇතුළත් කර ගනු ලැබිය හැකි ය.

(3) විශේෂිත වැඩසටහනකට අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු ඇතුළත් කර ගැනීම පිණිස ඔවුන් අනුකූලතාවය දැක්විය යුතු කොන්දේසි ආරක්ෂක කොට්ඨාසය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් විශේෂිත වැඩසටහනකට අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු ඇතුළත් කර ගැනීමට පෙර ආරක්ෂක කොට්ඨාසය විසින්, ඒ විශේෂිත වැඩසටහන යටතේ ආරක්ෂාව හෝ සහාය ලබා ගැනීමට සහ ඒ විශේෂිත වැඩසටහනට අදාළව අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් නියම කරනු ලබන කොන්දේසි පිළිපැදීමට ඒ අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ කැමැත්ත ලිඛිතව ලබා දෙන ලෙස ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට නියම කරනු ලැබිය යුතු ය.

## IX වන කොටස

## වන්දි සහ තාවකාලික ප්‍රදාන

*යුක්තියේ සහ සාධාරණත්වයේ පදනම මත වන්දි සහ තාවකාලික ප්‍රදාන ලබා දිය යුතු බව*

**60.** මේ පනතේ මේ කොටස යටතේ අපරාධයක වින්දිතයකුට යම් වන්දියක් ගෙවීම හෝ තාවකාලික ප්‍රදානයක් කිරීම යුක්තිය සහ සාධාරණත්වය මත පදනම් විය යුතු ය.

*අධිකරණය විසින් වන්දි මුදලක් ගෙවීමට නියෝග කළ හැකි බව*

**61.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකරණයක් විසින් චූදිතයකු වරදකරු කරනු ලැබීමේ දී, ඔහු වරදකරු කරනු ලැබූවේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සඳහා ඔහුට පනවනු ලැබිය හැකි යම් දණ්ඩනයකට අමතරව, මේ පනත යටතේ ඒ අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් වන්දි මුදල් ප්‍රමාණයක් අධිකරණය වෙත ගෙවීමට ඒ වරදකරු කරනු ලැබූ තැනැත්තාට නියෝග කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණයක් විසින් (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් කරන අවස්ථාවක දී, ඒ අධිකරණය විසින්-

(අ) ඒ වන්දිය ගෙවනු ලැබිය යුත්තේ කවර කාලසීමාවක් ඇතුළත ද යන්න නිශ්චිතව දැක්වීම; හෝ

(ආ) අවස්ථානුගත කරුණු මත පදනම්ව, ඒ වන්දිය වාරික පදනම මත ගෙවන ලෙස නියෝග කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අධිකරණය විසින් ගෙවීමට නියෝග කරන ලද යම් මුදල් ප්‍රමාණයක් ඒ අධිකරණය විසින් පනවන ලද දඩයක් මෙන් අයකර ගනු ලැබිය හැකි අතර, වන්දි අයකර ගැනීම සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඇතුළත් විධිවිධාන මේ වගන්තිය යටතේ වන්දි අයකර ගැනීම සඳහා අදාළ විය යුතු ය.

(4) වරදකරු කරනු ලැබූ තැනැත්තා දිළින්දකු වන අවස්ථාවක දී හෝ වන්දි මුදල අයකර ගැනීම පිණිස රාජසන්තක කිරීම සඳහා ඔහු සතුව වත්කම් කිසිවක් නොමැති අවස්ථාවක දී, පවත්නා සම්පත් ප්‍රමාණයට යටත්ව සහ මේ පනතේ මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව, වින්දිතභාවයට සරිලන වන්දියක් වශයෙන්, රුපියල් මිලියන එකක් නොඉක්මවන මුදල් ප්‍රමාණයක් අපරාධයේ වින්දිතයාට ගෙවන ලෙස අධිකරණය විසින් අධිකාරියට නියෝග කරනු ලැබිය හැකි ය.

වන්දි මුදල ගෙවීම පැහැර හැරීම

**62.** 61 වන වගන්තිය යටතේ ගෙවන ලෙස නියෝග කරන ලද වන්දි මුදල ගෙවීම වරදකරු කරනු ලැබූ තැනැත්තකු පැහැර හරින අවස්ථාවක දී-

(අ) ඒ නියෝගය මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරනු ලැබුවේ නම්, අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට; හෝ

(ආ) ඒ නියෝගය මහාධිකරණය විසින් කරනු ලැබුවේ නම්, අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට,

ඒ තැනැත්තා යටත් විය යුතු යඃ

එසේ වුව ද, ඒ වන්දි මුදල ගෙවීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් වරදකරු කරනු ලැබූ තැනැත්තා හට නොමැති බවට පරීක්ෂණයකින් පසුව අධිකරණය විසින් සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කරනු ලැබිය හැකි අතර, එවැනි ආඥාවක් ඇතුළත් කරනු ලැබූ අවස්ථාවක දී, 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනතේ අන්තර්ගත ප්‍රජා පාදක විශෝධන ආඥාවලට අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ආඥාව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**63.** 61 වන වගන්තිය යටතේ වන්දි මුදලක් ගෙවීම සඳහා නියෝගයක් කිරීමට පෙර, අධිකරණය විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනු ලැබිය හැකි යඃ- වන්දි ගෙවීමට නියෝග කිරීමට පෙර සැලකිය යුතු කරුණු

(අ) වරදෙහි ප්‍රතිඵලයක් ලෙස අපරාධයේ වින්දිතයා අත්විඳින ලද හිංසාවේ ස්වභාවය ඇතුළුව, වරද හා සම්බන්ධ සියලු තොරතුරු;

(ආ) යම් බරපතළකම වැඩි කිරීමේ හෝ ලිහිල් කිරීමේ කරුණු;

(ඇ) අපරාධයේ වින්දිතයා පරීක්ෂා කරන ලද රජයේ වෛද්‍ය නිලධරයාගේ වාර්තාව;

(ඈ) අපරාධයේ වින්දිතයාට සිදුව තිබිය හැකි මානසික හෝ චිත්තවේගීමය හානි පිළිබඳ යම් සාක්ෂි;

(ඉ) හිංසාව හේතුවෙන් අපරාධයේ වින්දිතයා විසින් අත්විඳින ලද යම් ඉපයීම්වල පාඩුවක්;

(ඊ) අපරාධයේ වින්දිතයා විසින් දරන ලද වෛද්‍ය වියදම් ඇතුළුව යම් වියදම්;

(උ) 8 වන වගන්තියේ සඳහන් වින්දිත බලපෑමේ ප්‍රකාශය;

(ඌ) වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් ඒ අපරාධයේ වින්දිතයාට දැනටමත් ගෙවා ඇති වෙනත් යම් වන්දියක් හෝ වෙනත් යම් අධිකරණයක්, කොමිෂන් සභාවක්, මණ්ඩලයක් හෝ තැනැත්තකු විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තාගෙන් අයකර ගෙන ඇති වෙනත් යම් වන්දියක් හෝ ඒ අපරාධයේ වින්දිතයාට දැනටමත් කරනු ලැබ ඇති වෙනත් යම් ප්‍රදානයක්; සහ

(එ) වරදෙහි ප්‍රතිඵලයක් ලෙස ඒ අපරාධයේ වින්දිතයා අත්විඳ තිබිය හැකි හිංසාවේ, අලාභයේ හෝ පාඩුවේ ස්වභාවය සහ ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා අධිකරණයට හෝ අධිකාරියට සහාය විය හැකි වෙනත් යම් තොරතුරක්.

**64.** (1) මේ පනතේ මේ කොටස යටතේ වන්දි මුදලක් සඳහා හෝ තාවකාලික ප්‍රදානයක් සඳහා වන ඉල්ලීමක් ඔප්පු කිරීමේ භාරය ඒ ඉල්ලීම කරනු ලබන තැනැත්තා වෙත පැවතිය යුතු ය. ඉල්ලීම ඔප්පු කිරීමේ භාරය

(2) යම් සාක්ෂි රීතියක හෝ සාක්ෂිවල ආවේශ්‍යතාව සම්බන්ධයෙන් වන යම් තහනමක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වන්දි මුදලක් ගෙවීම පිළිබඳව තීරණය කරනු ලබන අධිකරණයක් හෝ මේ පනත යටතේ තාවකාලික ප්‍රදානයක් ගෙවීම පිළිබඳව තීරණය කරනු ලබන අධිකාරිය විසින් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ හෝ නඩු කටයුතුවලට අදාළ වෙනත් යම් තැනැත්තකුගේ යම් ප්‍රකාශයක් සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

**65.** (1) අධිකරණයක් විසින් 61 වන වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ තැනැත්තකුගෙන් යම් මුදලක් වන්දියක් ලෙස අයකර ගනු ලබන අවස්ථාවක දී, ඒ අධිකරණය විසින් එසේ අයකර ගන්නා ලද මුදලින් සියයට විස්සක් ආරක්ෂණ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, ඉතිරි මුදල් ප්‍රමාණය අවස්ථාවෝචිත පරිදි, ඒ අපරාධයේ වින්දිතයාට, ඔහුගේ ළඟම ඥාතියාට, යැපෙන්නන්ට හෝ උරුමකරුවන්ට ගෙවනු ලැබිය යුතු ය. වන්දි මුදලක් ලැබීම සිවිල් නඩු කටයුතුවලට බාධාවක් නොවිය යුතු බව

(2) මේ වගන්තිය යටතේ අපරාධයක වින්දිතයකු විසින් වන්දි මුදලක් ලබා ගැනීම, ඒ අපරාධයේ වින්දිතයාට යම් සිවිල් නඩු කටයුත්තක දී යම් අලාභ ඉල්ලා සිටීමට ඇති අයිතියට අගතියක් නොවිය යුතු ය. එසේ වුව ද, ප්‍රදානය කළ යුතු අලාභය නිශ්චය කිරීමේ දී ඒ සිවිල් අධිකරණය විසින්, මේ වගන්තිය යටතේ ඒ අපරාධයේ වින්දිතයාට දැනටමත් ලැබී ඇති වන්දි මුදල පිළිබඳව සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

**66.** (1) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද වන්දි මුදල සම්බන්ධයෙන් වූ අධිකරණයේ තීරණය මගින් හෝ වන්දි ප්‍රදානය කිරීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකුට- අභියාචනා

(අ) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ඒ තීරණය ගෙන ඇති අවස්ථාවක දී, අධිකරණ බලය සහිත පළාත්බද මහාධිකරණයෙන්; හෝ

(ආ) මහාධිකරණයක් විසින් ඒ තීරණය ගෙන ඇති අවස්ථාවක දී, අභියාචනාධිකරණයෙන්,

ඒ තීරණය සමාලෝචනය කරන ලෙස ඉල්ලා සිටීමට අයිතිවාසිකම තිබිය යුතු ය.

(2) තීරණ සමාලෝචනය කිරීමට ඉල්ලීම සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටියට අදාළව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ VII වන කොටසේ අන්තර්ගත විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ තීරණ සමාලෝචනය කිරීම සඳහා වූ ඉල්ලීම් ගොනු කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**විශේෂ අවස්ථානුගත කරුණුවල දී අධිකාරිය විසින් තාවකාලික මුදල් ප්‍රදානයක් කරනු ලැබිය හැකි බව**

**67.** (1) බරපතළ වරදක් සම්බන්ධයෙන් වන විට, විශේෂ අවස්ථානුගත කරුණු මත, 69 වන වගන්තියේ දක්වා ඇති පරිදි උපදේශක මණ්ඩලයේ නිර්දේශය අනුව අධිකාරිය විසින් අපරාධයක වින්දිතයකුට තාවකාලික මුදල් ප්‍රදානයක් ගෙවීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තාවකාලික ප්‍රදානය, පවත්නා සම්පත් ප්‍රමාණය මත පදනම්ව-

(අ) 68 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, අපරාධයක වින්දිතයකුගේ හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුගේ ඉල්ලීම මත; සහ

(ආ) සිදු කර ඇතැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් වන නඩු කටයුතුවල අවසාන ප්‍රතිඵලය නොසලකා,

දෙනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "බරපතළ වරද" යන්නෙන්, දඩයක් සහිතව හෝ රහිතව අවම වශයෙන් අවුරුදු පහක බන්ධනාගාරගත කිරීමේ දඬුවමකින් දඬුවම් කරනු ලැබිය හැකි වරදක් අදහස් වේ.

**අධිකාරියෙන් තාවකාලික මුදල් ප්‍රදානයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම**

**68.** (1) (අ) අපරාධයක වින්දිතයකු හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින්, තාවකාලික මුදල් ප්‍රදානයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කොට, අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම්

ලේඛනයක් ද සමඟ අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ අපරාධයක වින්දිතයාගේ සියලුම ආදායම් මූලාශ්‍රවල සත්‍ය ප්‍රකාශයක් ඒ දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගත විය යුතු ය.

(ආ) (අ) වන ඡේදය යටතේ අපරාධයක වින්දිතයා වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් ඒ ඉල්ලීම, දිවුරුම් ප්‍රකාශය සහ වෙනත් ලේඛන ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් අපරාධයේ වින්දිතයාට ඒ ඉල්ලීම, දිවුරුම් ප්‍රකාශය සහ වෙනත් ලේඛන ඔහු විසින් ම ඉදිරිපත් කිරීමට නොහැකි වීමට හේතු පැහැදිලිව සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ ලැබුණු යම් ඉල්ලීමක්, දිවුරුම් ප්‍රකාශයක් සහ වෙනත් ලේඛන නිර්දේශ සඳහා උපදේශක මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

උපදේශක මණ්ඩලය විසින් තාවකාලික ප්‍රදාන ලබා දීම නිර්දේශ කළ යුතු බව

**69.** (1) 68 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යොමු කිරීමක් ලැබීමෙන් පසුව, ඒ යොමු කිරීම ලද දිනයේ සිට දින දහහතරක් ඇතුළත උපදේශක මණ්ඩලය විසින්-

(අ) තාවකාලික ප්‍රදානයක් සඳහා වන එක් එක් ඉල්ලීම යුක්තිය සහ සාධාරණත්වය මත පදනම්ව සලකා බැලිය යුතු ය; සහ

(ආ) අපරාධයේ වින්දිතයාට තාවකාලික ප්‍රදානයක් ලබාදිය යුතු ද යන්න පිළිබඳව වන තම නිර්දේශ අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී උපදේශක මණ්ඩලය විසින්-

(අ) අපරාධයේ වින්දිතයාට එරෙහිව සිදු කරන ලද වරදේ අදාළ සියලු අවස්ථානුගත කරුණු සහ අපරාධයේ වින්දිතයා විසින් අත්විඳින ලද හිංසා පිළිබඳව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය;

(ආ) තාවකාලික ප්‍රදානයක් සඳහා වන ඉල්ලීමේ සත්‍යතාව තහවුරු කරනු ලබන අදාළ සියලු සාක්ෂි, ලේඛන සහ ද්‍රව්‍ය සලකා බලනු ලැබිය යුතු ය; සහ

(ඇ) සිදු කර ඇතැයි කියනු ලබන වරද සම්බන්ධයෙන්, චූදිතයා හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් අපරාධයේ වින්දිතයාට දැනටමත් ගෙවා ඇති යම් වන්දියක් පිළිබඳව හෝ යම් අධිකරණයක්, කොමිෂන් සභාවක්, මණ්ඩලයක් හෝ තැනැත්තකු විසින් චූදිතයාගෙන් හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තාගෙන් දැනටමත් අයකර ගෙන ඇති යම් වන්දියක් පිළිබඳව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

**70.** (1) 69 වන වගන්තිය යටතේ උපදේශක මණ්ඩලයේ නිර්දේශ ලැබීමෙන් පසුව, අධිකාරිය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව, අධිකාරිය විසින් අපරාධයක වින්දිතයකුට තාවකාලික ප්‍රදානයක් දෙනු ලැබිය හැකි ය. තාවකාලික ප්‍රදානයක් ලබා දීම

(2) තාවකාලික ප්‍රදානයක් ලෙස අපරාධයක වින්දිතයකුට ප්‍රදානය කරන ලද මුදල් ප්‍රමාණය, අධිකාරිය විසින් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව කරනු ලැබිය යුතු නියමයක් මත, (4) වන උපවගන්තියේ සඳහන් ආපසු ගෙවීමේ වැඩපිළිවෙළ ප්‍රකාරව ඔහු විසින් අධිකාරිය වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) තාවකාලික ප්‍රදානයක් ආපසු ගෙවීම සඳහා අධිකාරිය විසින් කරනු ලබන යම් නියමයක්, අපරාධයේ වින්දිතයා විසින් තම දිවුරුම් ප්‍රකාශයේ ප්‍රකාශ කර ඇති පරිදි ඔහුගේ ඉපයීම් හැකියාව මත පදනම් විය යුතු ය.

(ආ) අපරාධයේ වින්දිතයා සේවාවියුක්ත නම් හෝ තාවකාලික ප්‍රදානය ආපසු ගෙවීම සඳහා ආදායම් මාර්ග කිසිවක් ඔහුට නොමැති නම් තාවකාලික ප්‍රදානය ආපසු ගෙවීම සඳහා නියමයක් නොකරනු ලැබිය යුතු ය.

(4) තාවකාලික ප්‍රදානයක් ආපසු ගෙවීම සඳහා නියමයක් කරනු ලබන අවස්ථාවක දී, අධිකාරිය විසින් අපරාධයේ වින්දිතයා සමඟ ආපසු ගෙවීමේ වැඩපිළිවෙළකට ඇතුළත් විය යුතු ය.

(5) අධිකාරිය විසින් අපරාධයක වින්දිතයකුගේ ඉපයීම් හැකියාව කාලීනව තක්සේරු කොට තාවකාලික ප්‍රදානයක් ආපසු ගෙවීම සඳහා කරන ලද නියමයක් වෙනස් කරනු ලැබිය හැකි ය.

**71.** (1) 70 වන වගන්තිය යටතේ තාවකාලික ප්‍රදානයක් ලෙස ලැබුණු යම් මුදලක් අධිකාරිය විසින් කරන ලද නියමයක් මත ආපසු ගෙවීමට යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක දී, අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත් අධිකරණය විසින්- තාවකාලික ප්‍රදානය ආපසු ගෙවීමට අපොහොසත් වීම

(අ) අධිකාරිය විසින් ඒ අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත; සහ

(ආ) ඒ මුදල් ප්‍රමාණය ආපසු ගෙවා නොමැති බවට අධිකාරියේ සභාපතිවරයාගේ අත්සන යටතේ ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත සහතිකයක් නිකුත් කිරීමෙන් පසුව,

ඒ මුදල් ප්‍රමාණය අධිකරණය මගින් පනවන ලද දඩයක් ලෙස අයකර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සහතිකයක් ඒ ආපසු නොගෙවීමේ කරුණ පිළිබඳව බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

**72.** අධිකාරිය විසින්, උපදේශක මණ්ඩලය විමසා, මේ පනතේ මේ කොටස යටතේ වන තාවකාලික ප්‍රදානවලට අදාළ පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු යː- තාවකාලික ප්‍රදාන සම්බන්ධයෙන් අධිකාරිය විසින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු බව

(අ) තාවකාලික ප්‍රදානයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය සහ ඉල්ලුම් කරන ආකාරය;

(ආ) තාවකාලික ප්‍රදානයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කළ හැකි කාලසීමාව;

(ඇ) තාවකාලික ප්‍රදානයක් ගෙවනු ලැබිය හැක්කේ යම් අවස්ථානුගත කරුණු යටතේ ද, ඒ අවස්ථානුගත කරුණු;

(ඈ) තාවකාලික ප්‍රදානයක් ගෙවනු ලබන කාර්ය පටිපාටිය සහ ආකාරය;

(ඉ) තාවකාලික ප්‍රදානයක් දෙනු ලැබීමට අදාළ කොන්දේසි;

(ඊ) තාවකාලික ප්‍රදානයක් ආපසු ගෙවනු ලැබිය හැකි අවස්ථානුගත කරුණු;

(උ) තාවකාලික ප්‍රදානයක් ආපසු ගෙවීමේ කාර්ය පටිපාටිය; සහ

(ඌ) තාවකාලික ප්‍රදානයක් අත්හිටුවනු ලැබිය හැකි හෝ ප්‍රදානයේ මුදල් ප්‍රමාණය අඩු කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණු.

වන්දි හෝ තාවකාලික ප්‍රදාන සඳහා හිමිකම නොමැති වීම

**73.** (1) (අ) සිදු කර ඇතැයි කියනු ලබන වරද සංස්ථාපනය වන ක්‍රියාව-

(i) සිදු වී නොමැති බවට;

(ii) අපරාධ නීතිය යටතේ ආවරණය නොවන බවට; හෝ

(iii) අපරාධයේ වින්දිතයා විසින් කරන ලද පහර දීමකට එරෙහිව ආත්මාරක්ෂාව සඳහා කර ඇති බවට,

ඔප්පු කරනු ලැබුවහොත්;

(ආ) වරද සිදු කරන ලද අවස්ථාවේ දී හෝ ඉන්පසුව අපරාධයේ වින්දිතයා සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු බව ඔප්පු කරනු ලැබුවහොත්; හෝ

(ඇ) අපරාධයේ වින්දිතයා, අවස්ථාවෝචිත පරිදි නඩු කටයුතු අවසානයේ දී හෝ ඒ අතරතුර දී, මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් වරදක් සඳහා වරදකරු වන බවට තීරණය කරනු ලැබුවහොත්,

මේ පනත යටතේ අධිකරණයකින් යම් වන්දියක් ලබා ගැනීමට හෝ අධිකාරියෙන් තාවකාලික ප්‍රදානයක් ලබා ගැනීමට යම් තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු ය.

(2) මේ පනත යටතේ අධිකාරියෙන් තාවකාලික ප්‍රදානයක් සඳහා ඉල්ලීමක් කිරීමට සහ තාවකාලික ප්‍රදානයක් ලැබීමට ශ්‍රී ලාංකික පුරවැසියකු පමණක් සුදුසුකම් ලැබිය යුතු ය.

ප්‍රදාන පිළිබඳව වන උපදේශක මණ්ඩලය

**74.** (1) අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා, 67 වන වගන්තිය යටතේ යම් තාවකාලික මුදල් ප්‍රදානයක් ගෙවීම සම්බන්ධයෙන් අධිකාරියට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා (මේ පනතේ "උපදේශක මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රදාන පිළිබඳව වන උපදේශක මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) උපදේශක මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද විශ්‍රාමික අධිකරණ නිලධරයකු;

(ආ) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ නොවන ධුරයක ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(ඇ) අධිකරණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ නොවන ධුරයක ඒ අමත්‍යාංශයේ නියෝජිතයකු;

(ඈ) විගණකාධිපතිවරයා විසින් නම් කරන ලද විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු; සහ

(ඉ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද, දිලික්ත නීති ක්ෂේත්‍රයේ අවුරුදු විස්සකට නොඅඩු පළපුරුද්ද සහිත නීතිඥවරයකු.

උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා

**75.** (1) අමාත්‍යවරයා විසින් 74 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ සඳහන් විශ්‍රාමික අධිකරණ නිලධරයා උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු අතර, නැවත පත් කිරීම සඳහා ඔහු සුදුසුකම් ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් උපදේශක මණ්ඩලයේ සභාපතිවරයාට ඕනෑම අවස්ථාවක දී ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගැනීමෙන් පසු බලපවත්වනු ලැබිය යුතු ය.

(4) උපදේශක මණ්ඩලයේ සභාපතිවරයාට, අසනීපයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් උපදේශක මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් හේතු දක්වා උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්

**76.** යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම නතර වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ, සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්,

ඒ තැනැත්තා උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

**77.** (1) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් උපදේශක මණ්ඩලයේ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගැනීමෙන් පසු බලපවත්වනු ලැබිය යුතු ය.

උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම

(2) උපදේශක මණ්ඩලයේ යම් සාමාජිකයකු -

(අ) ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී විෂමාචාරය සිදු කිරීම; හෝ

(ආ) වංචාව හෝ වංකභාවය හා සම්බන්ධ වරදක් සිදු කිරීම,

සම්බන්ධයෙන් වරදකරු බවට තීරණය කරනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් මේ පනතේ 74 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ උපදේශක මණ්ඩලයට ඒ සාමාජිකයා නම් කරන ලද යම් තැනැත්තකු විමසා, හේතු දක්වා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරන ලද උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට සහ ඉන්පසුව ධුරය දැරීම නතර කරනු ලැබිය යුතු ය.

(4) උපදේශක මණ්ඩලයේ යම් සාමාජිකයකු මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් 74 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පත් කළ සාමාජිකයා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

(6) උපදේශක මණ්ඩලයේ යම් සාමාජිකයකුට අසනීපයක්, අශක්නුතාවක් හෝ මාස තුනකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම යන හේතුවක් මත තාවකාලිකව සිය

ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඒ සාමාජිකයා විසින් ඒ නොහැකියාව පිළිබඳව අමාත්‍යවරයාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. එවිට, අමාත්‍යවරයා විසින් මේ පනතේ 74 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ කාලය තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

**උපදේශක මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුර කාලය**

**78.** උපදේශක මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් ඒ සාමාජිකයාගේ ධුරය හිස්කරන්නේ නම් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

**සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම**

**79.** උපදේශක මණ්ඩලයේ සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ මත වන යම් පාරිශ්‍රමික අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**උපදේශක මණ්ඩලයේ රැස්වීම්**

**80.** (1) උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු උපදේශක මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය. ඒ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගෙන් එක් අයකු තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(2) උපදේශක මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(3) සභාපතිවරයා හෝ උපදේශක මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දරන සාමාජිකයා විසින් උපදේශක මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

(4) උපදේශක මණ්ඩලය විසින් තීරණය කිරීම සඳහා වන සියලු කාරණා පිළිබඳව උපදේශක මණ්ඩලයේ රැස්වීමක දී කටයුතු කරනු ලැබිය යුතු අතර, පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතරය විසින් ඒ පිළිබඳව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(5) උපදේශක මණ්ඩලයේ රැස්වීමක දී සැලකිල්ලට ගනු ලබන යම් කාරණයක් සඳහා වන ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට ඔහුගේ මුල් ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, උපදේශක මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

උපදේශක මණ්ඩලයේ පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන් යම් ක්‍රියාවක් නිර්බල නොවන බව

**81.** උපදේශක මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් උපදේශක මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් නිර්බල වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

## X වන කොටස

## සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි දීම

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක

**82.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින් පවත්වනු ලබන යම් විමර්ශනයකට, පරීක්ෂණයකට හෝ නඩු කටයුත්තකට අදාළව, අවස්ථාවෝචිත පරිදි -

(අ) සාක්ෂි දීමට;

(ආ) සාක්ෂි ලබා ගැනීමට; හෝ

(ඇ) ප්‍රකාශයක් සිදු කිරීමට,

බලාපොරොත්තු වන යම් අපරාධයක වින්දිතයකු, සාක්ෂිකරුවකු හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් ඒ සාක්ෂි දීමට හෝ ලබා ගැනීමට හෝ ඒ ප්‍රකාශය සිදු කිරීමට ඒ අධිකරණය වෙත හෝ කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව, අධිකරණය හෝ කොමිෂන් සභාව විසින්, යුක්තිය පසිඳලීමේ උපරිම යහපත උදෙසා සහ අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සැපයීමේ ක්‍රියාමාර්ගයක් ලෙස, 84 වන සහ 85 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව සහ සුදුසු යයි සලකනු ලබන (මේ පනතේ "දුරස්ථ ස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නිශ්චිත දුරස්ථ ස්ථානයක් අතර සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් භාවිත කිරීම මගින්, අවස්ථාවෝචිත පරිදි, ඒ සාක්ෂි දීමට හෝ ලබා ගැනීමට හෝ ඒ ප්‍රකාශය සිදු කිරීමට ඒ අපරාධයේ වින්දිතයාට, සාක්ෂිකරුට හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියට අවසර ලබා දිය හැකි ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධයක් මගින්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 124 වන වගන්තිය යටතේ හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වීමට හෝ පැවැත්වීමට බලය දීමට ඒ අධිකරණයට හෝ කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

(3) අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් අදාළ අවස්ථානුගත කරුණු මත පදනම්ව, සිය මෙහෙයවීම යටතේ, 84 වන සහ 85 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව සහ ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ යම් දුරස්ථ ස්ථානයක් අතර සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් සාක්ෂියක් හෝ ප්‍රකාශයක් ලබාගෙන සටහන් කරනු ලැබිය හැකි ය.

(4) අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, යම් සාක්ෂියක් දීමට හෝ ලබා ගැනීමට හෝ යම් ප්‍රකාශයක් සිදු කිරීමට අවසර දෙනු ලබන අවස්ථාවක දී හෝ යම් සාක්ෂියක් හෝ ප්‍රකාශයක් ලබාගෙන සටහන් කිරීමට තීරණය කරන අවස්ථාවක දී, ඒ අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ ඉල්ලීම මත, අධිකාරිය විසින් එහි පවත්නා සම්පත් ප්‍රමාණයට යටත්ව ඵලදායී සම්බන්ධකයක් පිහිටුවීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය විය හැකි ආකාරයේ මූල්‍ය සහ වෙනත් සම්පත් හැකි උපරිම තාක් දුරට සැපයීම සහතික කරනු ලැබිය යුතු ය.

ඉල්ලීමක් තහවුරු කිරීම සහ ඉල්ලීමක් පිළිබඳ දැන්වීමක් කිරීම

**83.** (1) (අ) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් 82 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ-

(i) ශ්‍රී ලංකාව තුළ පිහිටි දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි දීමට හෝ ප්‍රකාශයක් සිදු කිරීමට ඉල්ලීමක් කිරීමට අදහස් කරන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ සාක්ෂිය දීමට හෝ ප්‍රකාශය සිදු කිරීමට නියමිත දිනයේ සිට අවම වශයෙන් දින තිහකට පෙර ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව ඉදිරියේ ඒ ඉල්ලීම තහවුරු කරනු ලැබිය යුතු ය;

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි දීමට හෝ ප්‍රකාශයක් සිදු කිරීමට ඉල්ලීමක් කිරීමට අදහස් කරන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ සාක්ෂිය දීමට හෝ ප්‍රකාශය සිදු කිරීමට නියමිත දිනයේ සිට අවම වශයෙන් දින හැටකට පෙර ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව ඉදිරියේ ඒ ඉල්ලීම තහවුරු කරනු ලැබිය යුතු ය.

(ආ) නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් 82 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කිරීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් අදාළ අධිකරණයට හෝ කොමිෂන් සභාවට ඒ ඉල්ලීම කිරීමට පෙර ඒ කාර්යය සඳහා අවසරය ලබා ගැනීම සඳහා අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) යම් අපරාධයක වින්දිතයකු, සාක්ෂිකරුවකු හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් 82 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කිරීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ අපරාධයේ වින්දිතයා, සාක්ෂිකරු හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් ඒ ඉල්ලීම කිරීමට පෙර, නීතිපතිවරයාට සහ ඒ විමර්ශනයේ, පරීක්ෂණයේ හෝ නඩු කටයුත්තේ අදාළ සියලු පාර්ශ්වකරුවන්ට ඒ ඉල්ලීම පිළිබඳව සාධාරණ පූර්ව දැන්වීමක් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදය ප්‍රකාරව පවත්වනු ලබන විමර්ශනයක් අතරතුර දී, චූදිත තැනැත්තකු එතෙක් හඳුනාගනු ලැබ නොමැති නම් හෝ නම් කරනු ලැබ නොමැති නම් නැතහොත් චූදිත තැනැත්තකු සොයාගත නොහැකි නම් හෝ නීතිය මගහැර සිටී නම්, නැතහොත් විමර්ශනයේ රහස්‍යභාවය පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නේ නම්, යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින්, අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ අවසරය ඇතිව කිසිදු පාර්ශ්වකරුවකුට දැන්වීමක් කිරීමෙන් තොරව අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ ප්‍රකාශයක් සටහන් කරගනු ලැබිය හැකි ය. චූදිත තැනැත්තා හඳුනාගනු ලැබූ, නම් කරනු ලැබූ, සොයාගනු ලැබූ හෝ අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවක දී ඒ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් සටහන් කරගනු ලැබූ එකී ප්‍රකාශය පිළිබඳව චූදිත තැනැත්තාට අනාවරණය කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශයේ උද්ධෘතයක් හෝ ඒ ප්‍රකාශය අන්තර්ගත වන දත්ත ගබඩා කිරීමේ උපාංගයක් නඩු විභාගය ආරම්භ කිරීමට පෙර ඔහුට ලබාදිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීමක් පිළිබඳව දැන්වීමක් ලැබුණු නීතිපතිවරයා හෝ යම් පාර්ශ්වකරුවකු විසින්, ඒ ඉල්ලීම පිළිබඳ දැන්වීම ලැබුණු දින සිට වැඩ කරන දින පහළොවක් ඇතුළත ස්වකීය නියෝජන විමර්ශනය, පරීක්ෂණය හෝ නඩු කටයුත්ත පැවැත්වීමට නියමිතව ඇති අධිකරණය හෝ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් ඒ නියෝජන ලැබුණු දින සිට වැඩ කරන දින පහළොවක් ඇතුළත ඒ නියෝජන පිළිබඳ ස්වකීය තීරණය, ඒ සඳහා හේතු ද සමඟ දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, ඒ සාක්ෂිය දීමට හෝ ලබා ගැනීමට හෝ ප්‍රකාශය සිදු කිරීමට යම් අපරාධයක වින්දිතයකුට, සාක්ෂිකරුවකුට හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට තවදුරටත් අවශ්‍ය නොවන අවස්ථාවක දී, ඒ අපරාධයේ වින්දිතයා, සාක්ෂිකරු හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් ඒ කරුණ පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, අදාළ අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ රෙජිස්ට්‍රාර්වරයාට හෝ ලේකම්වරයාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

**84.** පහත නිශ්චිතව දක්වා ඇති තාක්ෂණික අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන බවට අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් සෑහීමට පත්වන්නේ නම් පමණක් දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් යම් සාක්ෂියක් දීම හෝ ලබා ගැනීම හෝ යම් ප්‍රකාශයක් සිදු කිරීම හෝ යම් සාක්ෂියක් හෝ ප්‍රකාශයක් ලබාගෙන සටහන් කිරීම සඳහා ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් අවසර ලබා දිය හැකි යː-

අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් තාක්ෂණික සහ වෙනත් අවශ්‍යතා පිළිබඳව සෑහීමට පත්විය යුතු බව

(අ) අධිකරණය හෝ කොමිෂන් සභාව අසුන් ගන්නා පරිශ්‍රය සහ දුරස්ථ ස්ථානය-

(i) ඒ පරිශ්‍රයෙහි පැමිණ සිටින නඩු කටයුතුවලට සෘජුව ම අදාළ වන තැනැත්තන්ට, ඒ දුරස්ථ ස්ථානයෙහි පැමිණ සිටින නඩු කටයුතුවලට සෘජුව ම අදාළ වන තැනැත්තන් දැකීමට සහ ඇසීමට හැකියාව ලබා දෙන; සහ

(ii) ඒ දුරස්ථ ස්ථානයෙහි පැමිණ සිටින නඩු කටයුතුවලට සෘජුව ම අදාළ වන තැනැත්තන්ට, ඒ පරිශ්‍රයෙහි පැමිණ සිටින නඩු කටයුතුවලට සෘජුව ම අදාළ වන තැනැත්තන් දැකීමට සහ ඇසීමට හැකියාව ලබා දෙන,

ප්‍රමාණවත් පහසුකම්වලින් සමන්විත වන බව;

(ආ) (i) ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයේ ආකෘතිය;

(ii) සම්බන්ධකය ස්ථාපනය කිරීම සඳහා භාවිත කරන ලද උපකරණය හෝ උපකරණයේ පන්තිය;

(iii) කැමරාවල පිහිටීම;

(iv) සම්ප්‍රේෂණයේ තත්ත්වය හෝ වේගය;

(v) සන්නිවේදනයේ ගුණාත්මකභාවය; සහ

(vi) සම්බන්ධකය සම්බන්ධයෙන් වන වෙනත් යම් කාරණා,

සම්බන්ධයෙන් හෝ ඒවාට අදාළව අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ රීති මගින් නියම කරනු ලැබිය හැකි යම් අවශ්‍යතා සපුරාලන බව; සහ

(ඇ) මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා, මහෙස්ත්‍රාත්වරයා හෝ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් අවශ්‍යතා සපුරාලන බව:

එසේ වුව ද, මේ ඡේදය යටතේ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා, මහෙස්ත්‍රාත්වරයා හෝ කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි අවශ්‍යතා, මේ වගන්තියේ ඇතුළත් යම් විධිවිධානයකට අනනුකූල නොවිය යුතු ය.

අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් සම්බන්ධකයේ නිරවද්‍යතාවය ආදිය පිළිබඳව සෑහීමට පත්විය යුතු බව

**85.** (1) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක්, යම් දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ සාක්ෂියක් හෝ ප්‍රකාශයක් සටහන් කිරීම ආරම්භ කිරීමට පෙර, ඒ කාර්යය සඳහා යොදා ගන්නා ලද දිනයේ දී සහ වේලාවේ දී-

(අ) ඒ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය තාක්ෂණික වශයෙන් නිවැරදි සහ විශ්වසනීය වන බවට එය විසින් ම සෑහීමට පත්විය යුතු ය; සහ

(ආ) ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු අධිකරණ නිලධරයකු හෝ රජයේ නිලධරයකු ඒ දුරස්ථ ස්ථානයේ පැමිණ සිටින බවට සහතික විය යුතු ය.

(2) අධිකරණය හෝ කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ නම් කරන ලද අධිකරණ නිලධරයාට හෝ රජයේ නිලධරයාට-

(අ) ඒ දුරස්ථ ස්ථානයේ පැමිණ සිටින අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සහ නඩු කටයුතුවලට ඍජුව ම අදාළ

වන වෙනත් යම් තැනැත්තකු සමඟ, ප්‍රකාශය සටහන් කිරීමට පෙර හෝ පසුව සම්මුඛ සාකච්ඡාවක් සිදු කිරීමට; සහ

(ආ) අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු ප්‍රකාශය සිදු කරන්නේ හෝ සිදු කළේ ස්වේච්ඡාවෙන් ද යන වග සහ යම් බල කිරීමක්, තර්ජනය කිරීමක් හෝ බලපෑමක් නොමැතිව ද යන වග හෝ යම් ත්‍යාගයක් හෝ අල්ලසක් දීමේ ප්‍රතිඵලයක් වශයෙන් ද යන වග සඳහන් කරමින් ඔහුගේ නිරීක්ෂණයන් ද සමඟ වන වාර්තාවක් ඒ අධිකරණය හෝ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට,

නියම කරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා විසින් ඒ නියමයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "රජයේ නිලධරයා" යන්නට ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවය කරන නිලධරයකු ද ඇතුළත් වේ.

සාධාරණ නඩු විභාගයක් සඳහා චූදිතයකුට ඇති අයිතිවාසිකම

**86.** මේ පනත යටතේ දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, සාක්ෂි දීමට හෝ ලබා ගැනීමට හෝ ප්‍රකාශයක් සිදු කිරීමට අපරාධයක වින්දිතයකුට, සාක්ෂිකරුවකුට හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට අවසරය ලබා දීමට පෙර, ඒ සාක්ෂිය හෝ ප්‍රකාශය ඒ ස්ථානයේ සිට ඒ ක්‍රමය මගින් ලබා ගැනීම සහ සටහන් කිරීම මගින්-

(අ) යුක්තියේ උපරිම යහපත තහවුරු කරන්නේ ද; සහ

(ආ) සාධාරණ නඩු විභාගයක් සඳහා චූදිතයකුට ඇති අයිතිවාසිකමට අගතිදායක නොවන්නේ ද,

යන්න පිළිබඳව, අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලය, ශ්‍රී ලංකාවෙන් පිටත දුරස්ථ ස්ථානයක විය යුතු බව

**87.** මේ පනත යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි යම් දුරස්ථ ස්ථානයක සිට යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් සාක්ෂියක් දීමට හෝ ලබා ගැනීමට හෝ ප්‍රකාශයක් සිදු කිරීමට ඇති අවස්ථාවක දී, ඒ සාක්ෂිය දීමට හෝ ලබා ගැනීමට හෝ ප්‍රකාශය සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන රටේ පිහිටි ශ්‍රී ලංකා

රජයේ දූත මණ්ඩල කාර්යාලයේ සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් ඒ සාක්ෂිය හෝ ප්‍රකාශය එසේ දීම හෝ ලබා ගැනීම හෝ සිදු කිරීම කරනු ලැබිය යුතු ය.

ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය සඳහා වූ අවසරය වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සඳහා වන නියෝගය

**88.** අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් යුක්තිය පසිඳලීමේ උපරිම යහපත උදෙසා සහ වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත, යම් නඩු කටයුත්තකට අදාළව දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි හෝ ප්‍රකාශ සටහන් කිරීමට ප්‍රදානය කරන ලද අවසරයක් වෙනස් කරමින් හෝ අවලංගු කරමින් නියෝගයක්, ඒ නඩු කටයුත්තේ අදාළ පාර්ශ්වයන් වෙත දැන්වීමක් සිදු කොට, කරනු ලැබිය හැකි ය.

සාක්ෂිකරුවකු අධිකරණයේ සාක්ෂිකරුවකු ලෙස සලකනු ලැබිය යුතු බව

**89.** (1) මේ පනතේ මේ කොටස යටතේ දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි දෙන හෝ ප්‍රකාශයක් සිදු කරන යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු සියලු කාර්ය සඳහා, අධිකරණය ඉදිරියෙහි සාක්ෂි දෙන හෝ ප්‍රකාශයක් සිදු කරන අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා "අධිකරණය" යන්නෙන්, යම් අපරාධ නඩු කටයුතු පවත්වනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියෙහි ද, ඒ අධිකරණය අදහස් වේ.

## XI වන කොටස

### මූල්‍ය

අධිකාරියේ අරමුදල

**90.** (1) අධිකාරියට ඊට ම අයත් අරමුදලක් තිබිය යුතු ය.

(2) අධිකාරියේ අරමුදලට-

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ; සහ

(ආ) ත්‍යාග, පරිත්‍යාග, දායකත්ව මුදල්, රික්තවරණ හෝ ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර කවර හෝ මූලාශ්‍රයකින් අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණ,

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණ අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**91.** (1) (මේ පනතේ "ආරක්ෂණ අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතු ය. ආරක්ෂණ අරමුදල

(2) අධිකාරිය විසින් ආරක්ෂණ අරමුදල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම කරනු ලැබිය යුතු ය.

(3) ආරක්ෂණ අරමුදලට-

(අ) ඒ ආරක්ෂණ අරමුදලට පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ආ) ත්‍යාග, පරිත්‍යාග, දායකත්ව මුදල්, රික්තවරණ හෝ ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර කවර හෝ මූලාශ්‍රයකින් ආරක්ෂණ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබීම පිණිස අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ප්‍රමාණ; සහ

(ඇ) 65 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකරණයක් විසින් ප්‍රේෂණය කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ,

ගෙවනු ලැබිය යුතු ය.

(4) පහත දැක්වෙන ගෙවීම් සඳහා අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ ආරක්ෂණ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු යඃ-

(අ) අපරාධයක වින්දිතයන්ට සිදු වූ යම් ශාරීරික හානි හෝ ඔවුන්ගේ දේපළවලට සිදු වූ අලාභ සඳහා ගෙවනු ලබන වන්දි;

(ආ) 70 වන වගන්තිය යටතේ අපරාධයක වින්දිතයන්ට ප්‍රදානය කරනු ලබන තාවකාලික මුදල් ප්‍රදාන; සහ

(ඇ) අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් ලෙස මියගිය හෝ ශාරීරිකව හෝ මානසිකව අශක්නුතාවකට පත්ව ඇති අපරාධයක වින්දිතයකු මත යැපෙන, ඔහුගේ පවුලේ සාමාජිකයන්ට, ළඟම ඥාතියකුට සහ වෙනත් යම් තැනැත්තකුට ගෙවනු ලබන වන්දි.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා ආරක්ෂණ අරමුදලේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විය යුතු අතර, ඔහු විසින් ආරක්ෂණ අරමුදලේ ආදායම් හා වියදම් සහ වත්කම් හා බැරකම් පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම

**92.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් අධිකාරියේ ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු මුදල් ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ අරමුදලේ සහ ආරක්ෂණ අරමුදලේ ගිණුම් විගණනය කිරීමට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධිකාරියේ අරමුදලේ සහ ආරක්ෂණ අරමුදලේ මූල්‍ය පාලනයට සහ ගිණුම්වලට අදාළ විය යුතු ය.

## XII වන කොටස

### සාමාන්‍ය

වාර්ෂික වාර්තාව

**93.** (1) අධිකාරිය විසින් එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් මාස හයක කාලයක් ඇතුළත ඒ මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් කරගෙන යන ලද කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා

වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ වර්ෂයට අදාළව පහත දැක්වෙන එක් එක් ලේඛනවල පිටපත බැගින් ඒ වාර්තාවට අමුණනු ලැබීමට ද සැලැස්විය යුතු ය:-

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ අදාළ වර්ෂය සඳහා අධිකාරියේ විගණනය කරන ලද ගිණුම්; සහ

(ආ) අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ නීතිමය ප්‍රතිසංස්කරණ සඳහා වන යෝජනා ද ඇතුළත්ව, ඒ වාර්තාව සහ ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය සඳහා යෝජිත කටයුතු පිළිබඳ වාර්තාවක්.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන වාර්තාව සහ ලේඛන ලැබුණු දින සිට මාස දෙකක කාලයක් ඇතුළත ඒ වාර්තාවේ හා ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

බලතල ක්‍රියාත්මක කිරීම ආදියේ දී මැදිහත් වීම

**94.** මේ පනත යටතේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හෝ කිරීමේ දී යම් අධිකරණයක හෝ කොමිෂන් සභාවක හෝ අධිකාරියේ, මණ්ඩලයේ, ආරක්ෂක කොට්ඨාසයේ, උපදේශක මණ්ඩලයේ, නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක හෝ යම් රජයේ හෝ අධිකරණ නිලධරයකුගේ කටයුතුවලට නීත්‍යානුකූල අවසරයක් නොමැතිව මැදිහත්වන හෝ බාධා කරන, නැතහොත් මැදිහත් වීමට හෝ බාධා කිරීමට උත්සාහ කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි

**95.** මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී, ඒ පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාගත මණ්ඩලයක් වේ නම්, එවිට ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ සේවකයකු වූ සෑම තැනැත්තකු ම;

(ආ) හවුල් ව්‍යාපාරයක් වේ නම්, එවිට ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වූ සෑම තැනැත්තකු ම සහ එහි ප්‍රධාන විධායක නිලධරයා;

(ඇ) හවුල් ව්‍යාපාරයක් නොවන සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් වේ නම්, එවිට ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී, ඒ මණ්ඩලයේ සාමාජිකයකු වූ සෑම පුද්ගලයකු ම සහ ඒ මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු වූ සෑම නිලධරයකු ම; හෝ

(ඈ) පළාත් පාලන ආයතනයක් වේ නම් හෝ ඒ පළාත් පාලන ආයතනය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා පළාත් පාලන ආයතනයකට අදාළ යම් නීතියක් මගින් හෝ ඒ යටතේ පත් කරන ලද වෙනත් යම් ආයතනයක් වේ නම්, එවිට ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී, ඒ ආයතනයේ සභාපතිවරයා වූ තැනැත්තා,

ඒ වරද තමාගේ අනුදැනුමකින් තොරව සිදු කරනු ලැබ ඇති බවට හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය සම්පූර්ණ නිසි උද්යෝගයෙන් තමා කටයුතු කළ බවට, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා, පුද්ගලයා, නිලධරයා හෝ සභාපතිවරයා අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද සිදු කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

**96.** (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට බලාත්මකභාවයක් දීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නේ නම් මිස, යම් නඩු කටයුත්තක දී, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු මේ පනත යටතේ සහාය හෝ ආරක්ෂාව ලබන්නේ ද යන්න හෝ ලබා ඇත්තේ ද යන්න හෙළිදරව් කිරීමට කිසිදු තැනැත්තකුට බලපෑමක් නොකරනු ලැබිය යුතු ය. රහස්‍යභාවය

(2) මේ පනතේ විධිවිධානවලට බලාත්මකභාවයක් දීමේ කාර්යය හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල වීමේ කාර්යය සඳහා හැර, කිසිදු තැනැත්තකු විසින්, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු මේ පනත යටතේ සහාය හෝ ආරක්ෂාව ලබන්නේ ද යන්න හෝ ලබා ඇත්තේ ද යන්න වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් නොකරනු ලැබිය යුතු ය.

**97.** යම් අධිකරණයක දී හෝ කොමිෂන් සභාවක දී, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් දෙන ලද සාක්ෂියක විශ්වසනීයත්වය තක්සේරු කිරීමේ දී, මේ පනත යටතේ අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු යම් සහායක් හෝ ආරක්ෂාවක් ලබන බවට හෝ ලබා ඇති බවට වූ කාරණය අදාළ නොවිය යුතු ය.

සාක්ෂියක විශ්වසනීයත්වය පිළිබඳ තක්සේරුව

**98.** මණ්ඩලයේ සාමාජිකයන්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හා වෙනත් සියලු නිලධරයන් හා සේවානියුක්තයන් සහ අධිකාරිය මගින් පත් කරන ලද විශේෂඥ උපදේශකවරුන් සහ උපදේශකවරුන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ ඒවායේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**99.** අධිකාරියේ සහකාර අධ්‍යක්ෂවරයාගේ නිලය හෝ ඊට ඉහළ නිලයක් දරන සෑම නිලධරයකු ම අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කාර්ය සඳහා සාම නිලධරයකු විය යුතු ය.

අධිකාරියේ නිලධරයන් සාම නිලධරයන් වන බව

**100.** අධිකාරිය, (52 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව

**101.** (1) අධිකාරිය විසින් පහත දැක්වෙන කාරණා ඇතුළුව මේ පනත යටතේ රීති සාදනු ලැබීමට නියම කරන ලද කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:-

රීති

(අ) 52 වන වගන්තිය යටතේ අධිකාරියේ නිලධරයන්ගේ සහ වෙනත් සේවානියුක්තයන්ගේ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි, පාරිශ්‍රමික සහ විනය පාලනය සහ ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් සඳහා වූ සුබසාධන සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම; සහ

(ආ) 54 වන වගන්තිය යටතේ ආරක්ෂක කොට්ඨාසයේ කටයුතුවල රහස්‍යභාවය සහතික කිරීම සහ ආරක්ෂක කොට්ඨාසයේ පොලිස් නිලධරයන්ගේ අපක්ෂපාතී බව සහ වගවිය යුතු බව සහතික කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් සාදන ලද සෑම රීතියක් ම ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

නියෝග

**102.** (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝගය එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (අ) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ පූර්වයෙන් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම සහ ඉතිරි කිරීම

**103.** (1) 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) (මේ වගන්තියේ "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ඉවත් කිරීම නොතකා-

(අ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ

ජාතික අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද සෑම පත් කළ සාමාජිකයකු ම නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහු කලින් ඉල්ලා අස්වන්නේ නම්, මිය යන්නේ නම් හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, ඔහු පත් කරනු ලැබ ඇති ඔහුගේ ධුර කාලය ඉකුත්වන තෙක් අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තවදුරටත් ධුරය දරනු ලැබිය යුතු ය;

(ආ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සේවයෙහි නියුක්තව සිටි සියලු සේවානියුක්තයන් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරියේ සේවානියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය විසින් හෝ ඊට එරෙහිව නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ගොනු කර ඇති සහ අවසන් නොවී පවත්නා සියලු නඩු, අපරාධ නඩු, සිවිල් නඩු, නඩු කටයුතු, කාරණා හෝ දේවල් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරිය විසින් හෝ ඊට එරෙහිව ගොනු කර ඇති නඩු, අපරාධ නඩු, සිවිල් නඩු, නඩු කටයුතු, කාරණා හෝ දේවල් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) යම් සිවිල් නඩුවක දී, කාරණයක දී, නඩු කටයුත්තක දී හෝ දෙයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් හෝ වෙනත් මණ්ඩලයක් විසින්, ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට පක්ෂව හෝ ඊට විරුද්ධව ඇතුළත් කරන ලද හෝ කරන

ලද යම් තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදානයක් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරියට පක්ෂව හෝ ඊට විරුද්ධව ඇතුළත් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය;

(ඉ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අයත් වූ සියලු වංචල හෝ නිශ්චල දේපළ නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරිය සතු විය යුතු අතර, අධිකාරියේ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදලේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බැරට පවතින සියලු මුදල් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද ආරක්ෂණ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය;

(උ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ අරමුදලේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බැරට පවතින සියලු මුදල් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරියේ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය;

(ඌ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය විසින් සහ එය සමඟ එළඹෙන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක ව පවතින්නා වූ සියලු ගිවිසුම් සහ එකඟතා මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරිය විසින් සහ එය සමඟ එළඹෙන ලද ගිවිසුම් සහ එකඟතා ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(එ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සියලු ණය, වගකීම් සහ බැරකම් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරියේ ණය, වගකීම් සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

**104.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ- අර්ථ නිරූපනය

"අපරාධයක ළමා වින්දිතයා" සහ "ළමා සාක්ෂිකරු" යන්නෙන්, පිළිවෙළින්, වයස අවුරුදු දහඅටට අඩු අපරාධයක වින්දිතයකු සහ සාක්ෂිකරුවකු අදහස් වේ;

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නට-

(අ) (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක්;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක්;

(ඇ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව;

(ඈ) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව; සහ

(ඉ) පරීක්ෂණ පැවැත්වීම සඳහා නීතියෙන් බලය දී ඇති වෙනත් යම් කොමිෂන් සභාවක්,

ඇතුළත් වේ;

"අයි.සී.සී.පී.ආර්. පනත" යන්නෙන්, 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත අදහස් වේ;

"හිංසාව" යන්නෙන්, යම් තැනැත්තකුගේ ශරීරයට, මනසට, කීර්ති නාමයට හෝ දේපළට නීති විරෝධීව සිදු කරන ලද කවර ආකාරයක හෝ හානියක් අදහස් වන අතර, ඊට-

(අ) යම් නීතියක් යටතේ වන වරදක්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව හෝ 13 වන ව්‍යවස්ථාවේ (1) වන හෝ (2) වන අනුව්‍යවස්ථාව යටතේ සුරක්ෂිත කොට ඇති යම් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක්; හෝ

(ඇ) අයි.සී.සී.පී.ආර්. පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අයිතිවාසිකමක් කඩ කිරීමක්,

සංයුක්ත කරන්නා වූ යම් ක්‍රියාවක හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ යම් දුබලතාවයක් හෝ ආබාධයක්, චිත්තවේගීමය වේදනාවක්, ආර්ථික හෝ වෙනත් පාඩුවක් ඇතුළත් වේ;

"නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය" යන්නෙන්, වරදක් සිදු කිරීම පිළිබඳව විමර්ශනය කිරීමට යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ බලය දෙනු ලැබ ඇති පොලිස් නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, අධිකරණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

''සංවිධානාත්මක අපරාධ කණ්ඩායම" යන්නෙන්, අපරාධ සිදු කිරීම සඳහා සංවිධානගත වී ඇති තැනැත්තන් කණ්ඩායමක් අදහස් වේ;

"රජයේ අධිකාරිය" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හැර වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවනු ලද්දා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් අන්‍යාකාරයකින් අරමුදල් හෝ ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් ම හෝ අරමුදල්වලින් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද අධිකාරියක්, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"අදාළ අධිකාරිය" යන්නෙන්, එක් එක් කාරණයේ අවස්ථානුගත කරුණු අනුව අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු සමග නීත්‍යනුකූල ලෙස අන්‍යෝන්‍යව කටයුතු කරන නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ රජයේ අධිකාරියක් අදහස් වේ;

''ප්‍රතිෂ්ඨාපන යුක්තිය" යන්නෙන්, යුක්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා ආරවුලක සියලු පාර්ශ්වයන් සමථකරණ ක්‍රියාවලියක යොදවනු ලබන කාර්ය පටිපාටියක් අදාළ කර ගැනීම අදහස් වේ;

"අපරාධයක වින්දිතයා" යන්නෙන්, යම් හිංසාවක් අත්විඳ ඇති තැනැත්තකු අදහස් වන අතර ඊට, අදාළ වන අවස්ථාවල දී-

(අ) අපරාධයක වින්දිතයාගේ පවුලේ සාමාජිකයකු හෝ අපරාධයක වින්දිතයාගේ යැපෙන්නකු;

(ආ) අපරාධයක වින්දිතයකුට සුවිශේෂී වැදගත්කමක් ඇති තැනැත්තකු;

(ඇ) අපරාධයක වින්දිතයකුට සහාය වීමට මැදිහත්වීමේ දී හිංසාවක් අත්විඳින තැනැත්තකු;

(ඈ) වෙනත් තැනැත්තකු වින්දිතභාවයට පත් වීමෙන් වළක්වාලීමේ දී හිංසාවක් අත්විඳින තැනැත්තකු; සහ

(ඉ) අපරාධයක ළමා වින්දිතයකු,

ඇතුළත් වේ; සහ

"සාක්ෂිකරුවකු" යන්නෙන්-

(අ) යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත යම් තොරතුරු සපයනු ලැබ හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබ ඒ තොරතුරු හෝ පැමිණිල්ල පදනම් කරගෙන, යම් සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් හෝ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හෝ අයි.සී.සී.පී.ආර්. පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අයිතිවාසිකමක් කඩ කිරීම සම්බන්ධයෙන් යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් ආරම්භ කිරීමට ඉඩ ඇති හෝ ආරම්භ කොට ඇති අවස්ථාවක දී, එසේ ඒ තොරතුරු සපයා ඇති හෝ පැමිණිල්ල ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු;

(ආ) යම් සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් හෝ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හෝ අයි.සී.සී.පී.ආර්. පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අයිතිවාසිකමක් කඩ කිරීම සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් අතරතුර දී, යම් තොරතුරක් සපයා ඇති හෝ ප්‍රකාශයක් සිදු කර ඇති යම් තැනැත්තකු;

(ඇ) අපරාධයක වින්දිතයකු විසින් කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් හෝ අපරාධයක වින්දිතයකු විසින් හෝ ඔහු වෙනුවෙන් ගොනු කරන

ලද යම් නඩු කටයුත්තක දී ප්‍රකාශයක් සිදු කර ඇති, දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති හෝ සාක්ෂි දී ඇති යම් තැනැත්තකු;

(ඇ) කොමිෂන් සභාවකට යම් තොරතුරු හෝ සන්නිවේදන සපයා ඇති හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි සාක්ෂි දී ඇති යම් තැනැත්තකු;

(ඉ) නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට, අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට සපයන ලද යම් තොරතුරු හෝ සිදු කරන ලද ප්‍රකාශයක් මත පදනම්ව හෝ දෙන ලද කටඋත්තරයක් හෝ ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් මත පදනම්ව, වෙනත් යම් තැනැත්තකුට එරෙහිව වූ යම් නඩු කටයුත්තක දී, විමර්ශනයක දී හෝ පරීක්ෂණයක දී යම් ආකාරයකින් සහභාගී වීම සඳහා අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින් තමා කැඳවනු ලැබිය හැකි බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති යම් තැනැත්තකු;

(ඊ) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි පැවැත්වෙන යම් නඩු කටයුත්තකට අදාළව ප්‍රකාශයක් සිදු කිරීමට, දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට, සාක්ෂි දීමට හෝ යම් ලේඛනයක්, වාර්තාවක් හෝ දෙයක් ඉදිරිපත් කිරීමට ඒ අධිකරණයෙන් හෝ කොමිෂන් සභාවෙන් සිතාසි ලැබී ඇති යම් තැනැත්තකු; හෝ

(උ) රජයේ නිලධරයකු වශයෙන්, යම් සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් හෝ යම් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හෝ අයි.සී.සී.පී.ආර්. පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අයිතිවාසිකමක් කඩ කිරීම සම්බන්ධයෙන් යුක්තිය පසිඳලීමෙහි යම් ආකාරයකින් නිරතව ඇති යම් තැනැත්තකු,

අදහස් වන අතර, ඊට-

(i) අපරාධයක වින්දිතයකු;

(ii) ළමා සාක්ෂිකරුවකු;

(iii) ළමා සාක්ෂිකරුවකුගේ මව හෝ පියා හෝ භාරකරුවකු;

(iv) ඒ සාක්ෂිකරුගේ පවුලේ සාමාජිකයකු හෝ යැපෙන්නකු;

(v) යම් සාක්ෂිකරුවකුට සුවිශේෂී වැදගත්කමක් ඇති වෙනත් යම් තැනැත්තකු;

(vi) විශේෂඥ සාක්ෂිකරුවකු; සහ

(vii) යම් සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් හෝ යම් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හෝ අයි.සී.සී.පී.ආර්. පනත යටතේ ප්‍රදානය කරන ලද යම් අයිතිවාසිකමක් කඩ කිරීම සම්බන්ධයෙන් සැක කරනු ලබන හෝ චෝදනා ලබා ඇති තැනැත්තකු වෙනුවෙන් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරියෙහි සාක්ෂි දීමට කැඳවනු ලැබ ඇති යම් තැනැත්තකු,

ද ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**105.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පළමුවන උපලේඛනය

(10 වන වගන්තිය)

**අයිතිවාසිකම් හෝ හිමිකම් උල්ලංඝනය කිරීම හෝ අහිමි කිරීම පිළිබඳ පැමිණිලි විමර්ශනය සහ පරීක්ෂණය කිරීමට අදාළ කාර්ය පටිපාටිය**

**1.** (1) මේ පනතේ 10 වන වගන්තිය යටතේ අධිකාරිය වෙත ලැබුණු සෑම පැමිණිල්ලක් ම පහත දැක්වෙන පරිදි වර්ග කරනු ලැබිය යුතු යඃ-

(අ) අධිකාරිය විසින් කටයුතු කරනු ලැබිය යුතු, මේ පනත යටතේ වූ අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කිරීම හෝ අහිමි කිරීම නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්න වීම සම්බන්ධයෙන් වන පැමිණිලි;

(ආ) ආරක්ෂක කොට්ඨාසය වෙත යොමු කරනු ලැබිය යුතු, මේ පනත යටතේ වරදක් සිදු කිරීම පිළිබඳව වන පැමිණිලි; සහ

(ඇ) මේ පනත ප්‍රකාරව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීම අවශ්‍ය නොවන කාරණා.

(2) (1)(ඇ) වන අනුඡේදය යටතේ වන යම් තීරණයක්, අධිකාරිය විසින් පත් කරනු ලැබිය යුතු (මේ උපලේඛනයේ "අධ්‍යක්ෂ (නීති)" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ (නීති) ගේ අනුමතය ඇතිව ගනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය විසින් නිශ්චිත කාලසීමාවක් තුළ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන කාර්ය පටිපාටියක් සකස් කරනු ලැබිය යුතු අතර, ඒ කාර්ය පටිපාටිය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**2.** මේ උපලේඛනයේ 1(1)(අ) ඡේදයේ සඳහන් යම් පැමිණිල්ලක් සම්බන්ධයෙන් වන විමර්ශනයක් හෝ පරීක්ෂණයක් අධ්‍යක්ෂ (නීති) විසින් නම් කරනු ලැබිය යුතු අධිකාරියේ නිලධරයකු විසින් සිදු කරනු ලැබිය යුතු ය.

**3.** මේ උපලේඛනයේ 2 වන ඡේදයේ සඳහන් නිලධරයාට මේ පනතේ 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ දක්වා ඇති බලතල තිබිය යුතු ය.

**4.** (1) විමර්ශනය හෝ පරීක්ෂණය පවත්වනු ලබන නිලධරයා විසින් විමර්ශනයේ හෝ පරීක්ෂණයේ සටහන් ලිඛිතව තබා ගනු ලැබිය යුතු අතර-

(අ) සාක්ෂි මගින් අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කිරීමක් හෝ අහිමි කිරීමක් නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්න වීමක් අනාවරණය වන්නේ ද; නැතහොත්

(ආ) පැමිණිල්ල සනාථ කිරීම සඳහා සාක්ෂි ප්‍රමාණවත් නොවන්නේ ද,

යන්න පිළිබඳව සති හතරක කාලසීමාවක් ඇතුළත තීරණයකට එළඹිය යුතු ය.

(2) සති හතරක කාලසීමාවක් ඇතුළත විමර්ශනය හෝ පරීක්ෂණය අවසන් කිරීමට නොහැකි වන අවස්ථාවක දී, කාලය දීර්ඝ කිරීමක් සඳහා ඒ නිලධරයා විසින් අධ්‍යක්ෂ (නීති) වෙතින් අවසරය ලබාගනු ලැබිය යුතු ය.

**5.** (1) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කිරීමක් හෝ අහිමි කිරීමක් නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්න වීමක් සිදු වී ඇති බවට විමර්ශනය හෝ පරීක්ෂණය පවත්වනු ලබන නිලධරයා තීරණයකට එළැඹෙන අවස්ථාවක දී, ඔහු විසින් විමර්ශනය හෝ පරීක්ෂණය අතරතුර භාවිත කරන ලද යම් ලිපිලේඛන සහ සාක්ෂි සටහන් ද සමඟ තම නිර්දේශ සහිත වාර්තාවක් අධ්‍යක්ෂ (නීති) වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) විමර්ශනය හෝ පරීක්ෂණය තවදුරටත් කරගෙන යාම සඳහා සාක්ෂි ප්‍රමාණවත් නොවන බවට ඒ නිලධරයා තීරණයකට එළැඹෙන අවස්ථාවක දී, ඔහු විසින් ඒ විමර්ශනය හෝ පරීක්ෂණය, අධ්‍යක්ෂ (නීති) ගේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමතය ඇතිව නතර කරනු ලැබිය යුතු ය.

**6.** අධ්‍යක්ෂ (නීති) විසින් මේ උපලේඛනයේ 5 වන ඡේදය යටතේ ඔහු වෙත ලැබුණු විමර්ශන හෝ පරීක්ෂණ වාර්තාව සලකා බලනු ලැබිය යුතු අතර, පැමිණිලි කරන ලද අයිතිවාසිකම හෝ හිමිකම උල්ලංඝනය කිරීම හෝ අහිමි කිරීම නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්න වීම සම්බන්ධයෙන් ප්‍රතිකර්ම යෙදීම සඳහා හෝ සහන සැලසීම සඳහා අදාළ තැනැත්තන්ට විධාන කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තන් ඒ විධානයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ ඒ විධානයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

**7.** (1) අදාළ කාරණය විධාන මගින් විසඳිය නොහැකි අවස්ථාවක දී හෝ විධානවලට අනුකූලව කටයුතු නොකරන ලද අවස්ථාවක දී, අධ්‍යක්ෂ (නීති) විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා ඒ කරුණ පිළිබඳව මණ්ඩලයට වාර්තා කරනු ලැබිය යුතු අතර, ඒ කාරණය පිළිබඳව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සිදු කිරීම සඳහා අනුමණ්ඩලයක් පත් කරන ලෙසට මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) ඒ ඉල්ලීම ලැබීමෙන් පසුව, මණ්ඩලය විසින් මණ්ඩලයේ සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත අනුමණ්ඩලයක් ඒකමතිකත්වයෙන් පත් කරනු ලැබිය යුතු අතර, ඒ අනුමණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(3) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකමක් හෝ හිමිකමක් උල්ලංඝනය කරන ලදැයි හෝ අහිමි කරන ලදැයි නැතහොත් උල්ලංඝනය කිරීමට හෝ අහිමි කිරීමට අත්‍යාසන්නව ඇතැයි යන්න පිළිබඳව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වනු ලබන අනුමණ්ඩලයට මේ පනතේ 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ දක්වා ඇති බලතල තිබිය යුතු ය.

(4) අනුමණ්ඩලය විසින් විමර්ශනය හෝ පරීක්ෂණය කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් අනුමණ්ඩලයේ සාමාජිකයන් අතර වෙනස් මත ඇති අවස්ථාවක දී, බහුතර සාමාජිකයන්ගේ මතය බලපැවැත්විය යුතු ය.

(5) මේ ඡේදය යටතේ විමර්ශනය හෝ පරීක්ෂණය අවසානයේ දී, අනුමණ්ඩලය විසින් ඒ පිළිබඳව තම නිර්දේශ ද සමඟ වාර්තාවක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) අනුමණ්ඩලයේ වාර්තාව ලැබුණු පසු, ඒ කාරණය පිළිබඳව මණ්ඩලය විසින් සුදුසු සහ උචිත යයි සලකනු ලබන යම් ක්‍රියාමාර්ගයක් මණ්ඩලය විසින් ගනු ලැබිය යුතු ය.

## දෙවන උපලේඛනය

(29 වන, 30 වන, 31 වන සහ
73 වන වගන්ති)

**අධිකාරිය හෝ ආරක්ෂක කොට්ඨාසය විසින් අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සපයනු ලැබිය යුතු වැරදි**

| | පනත | වගන්තිය | වරද |
|---|---|---|---|
| 1. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය | 296 | මිනී මැරුම |
| 2. | | 297 | මිනී මැරුමක් නොවන උපවාද්‍ය මනුෂ්‍ය ඝාතනය |
| 3. | | 300 | මිනී මැරුමට තැත් කිරීම |
| 4. | | 316 | ස්වේච්ඡාවෙන් ම බරපතළ තුවාල සිදු කිරීම |
| 5. | | 354 | අපහරණය කිරීම |

| | පනත | වගන්තිය | වරද |
|---|---|---|---|
| 6. | | 355 | මිනී මැරුම සඳහා අපහරණය කිරීම හෝ පැහැරගෙන යෑම |
| 7. | | 356 | රහසිගතව හා අයුතු ලෙස යම් තැනැත්තකු සිරකර තැබීමේ චේතනාවෙන් අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම |
| 8. | | 357 | යම් ස්ත්‍රියක බලෙන් විවාහ කරවීම ආදිය පිණිස ඇය අපහරණය කිරීම හෝ පැහැරගෙන යෑම |
| 9. | | 358 | බරපතළ තුවාල කිරීම හෝ වහල් බවට ගැනීම ආදියකට යම් තැනැත්තකු යටත් කිරීම සඳහා අපහරණය කිරීම හෝ පැහැරගෙන යෑම. |
| 10. | | 360 | ළමයකුගේ ශරීරයෙන් චංචල දේපළ සොරකම් කිරීමේ චේතනාවෙන් ඒ ළමයා අපහරණය කිරීම හෝ පැහැරගෙන යෑම. |
| 11. | | 360අ | කුට්ටනය |
| 12. | | 360ආ | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම. |
| 13. | | 360ඇ | තැනැත්තන් වෙළෙඳාම් කිරීම. |
| 14. | | 362අ | මිනිසකු විසින්, නීත්‍යානුකූලව විවාහ කර ගෙන ඇතැයි යන විශ්වාසය වංචාවෙන් ඇති කොට සංවාසයේ යෙදීම. |
| 15. | | 362ආ | ද්විවිවාහය |
| 16. | | 362ඇ | මුල් විවාහය සඟවා ද්වි විවාහය සිදු කිරීම |
| 17. | | 362ඈ | නීත්‍යානුකූල විවාහ වීමක් නොමැතිව වංචනික චේතනාවෙන් විවාහ චාරිත්‍ර විධි පැවැත්වීම |
| 18. | | 364 | ස්ත්‍රී දූෂණය |
| 19. | | 364අ | ව්‍යාභිචාරය |
| 20. | | 365ආ | බරපතළ ලිංගික අපයෝජනය |
| 21. | | 373 | ත්‍රාසාද්ග්‍රහණය |
| 22. | | 374 | ත්‍රාසාද්ග්‍රහණය සිදු කිරීම සඳහා හානි කිරීමේ බියකට යම් තැනැත්තකු පත් කිරීම නැතහොත් එලෙස බියට පත් කිරීමට තැත් කිරීම. |

| | පනත | වගන්තිය | වරද |
|---|---|---|---|
| 23. | | 375 | මරණය හෝ බරපතළ තුවාල කිරීමේ බියකට යම් තැනැත්තකු පත් කිරීමෙන් කරනු ලබන ත්‍රාසාද්ග්‍රහණය. |
| 24. | | 376 | ත්‍රාසාද්ග්‍රහණය සිදු කිරීම සඳහා මරණය සිදු කරනු ලැබීමේ හෝ බරපතළ තුවාල සිදු කරනු ලැබීමේ බියකට යම් තැනැත්තකු පත් කිරීම |
| 25. | | 377 | මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු දහයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සම්බන්ධයෙන් චෝදනා කිරීමට තර්ජනය කිරීමෙන් කරනු ලබන ත්‍රසාද්ග්‍රහණය |
| 26. | | 378 | ත්‍රසාද්ග්‍රහණය කිරීම සඳහා මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු දහයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබීමේ බියකට යම් තැනැත්තකු පත් කිරීම. |
| 27. | | 380 | කොල්ලකෑම |
| 28. | | 381 | කොල්ලකෑමට තැත් කිරීම |
| 29. | | 382 | කොල්ලකෑමේ දී හෝ එසේ කිරීමට තැත් කිරීමේ දී ස්වෙච්ඡාවෙන් ම තුවාල සිදු කිරීම |
| 30. | | 383 | මරණය හෝ බරපතළ තුවාල හෝ සිදු කිරීමට තැත් කර කොල්ලකෑම. |
| 31. | | 384 | මාරක ආයුධයකින් සන්නද්ධව සිටිමින් කොල්ලකෑමට තැත් කිරීම |
| 32. | | 385 | පුරුද්දක් වශයෙන් සොරකම් කිරීමේ කාර්යයට සම්බන්ධ වූ තැනින් තැන යන තැනැත්තන් කණ්ඩායමකට අයත් වීම |
| 33. | | 418 | රුපියල් සියයක හෝ ඊට වැඩි ප්‍රමාණයක අලාභයක් කිරීමේ චේතනාවෙන් ගින්නෙන් හෝ පුපුරණ ද්‍රව්‍යයකින් අනර්ථය සිදු කිරීම. |
| 34. | | 419 | ගෙයක් ආදිය විනාශ කිරීමේ චේතනාවෙන් ගින්නෙන් හෝ පුපුරණ ද්‍රව්‍යයකින් අනර්ථය සිදු කිරීම. |
| 35. | | 420 | තට්ටු සහිත යාත්‍රාවක් හෝ ටොන් දහයක හෝ ඊට වැඩි ප්‍රමාණයක බර පැටවිය හැකි යාත්‍රාවක් විනාශ කිරීමේ හෝ එය ආරක්ෂා රහිත කිරීමේ චේතනාවෙන් අනර්ථය සිදු කිරීම |

| | පනත | වගන්තිය | වරද |
|---|---|---|---|
| 36. | | 421 | 420 වන වගන්තියෙහි විස්තර කර ඇති අනර්ථය, ගින්නෙන් හෝ යම් පුපුරණ ද්‍රව්‍යයකින් සිදු කිරීම |
| 37. | | 435 | මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීම සඳහා ගෙයකට අයුතු ලෙස ඇතුළු වීම |
| 38. | | 437 | අවුරුදු දහයකට අඩු කාලයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් සිදු කිරීම සඳහා ගෙයකට අයුතු ලෙස ඇතුළු වීම |
| 39. | | 438 | තුවාල සිදු කිරීම, අඩන්තේට්ටම් කිරීම ආදියට සූදානම් වී ගෙයකට අයුතු ලෙස ඇතුළු වීම. |
| 40. | | 440 | බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදක් කිරීම සඳහා රෑක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළු වීම හෝ ගෙවල් බිඳීම. |
| 41. | | 441 | තුවාල සිදු කිරීම හෝ අඩන්තේට්ටම් කිරීම ආදියට සූදානම් වීමෙන් පසු රෑක සිට අයුතු ලෙස ගෙයකට ඇතුළු වීම හෝ ගෙවල් බිඳීම |
| 42. | | 444 | තුවාල කිරීම ආදියට සූදානම් වීමෙන් පසු රාත්‍රියෙහි රෑක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළු වීම හෝ රාත්‍රියෙහි ගෙවල් බිඳීම |
| 43. | | 445 | රෑක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළු වීම හෝ ගෙවල් බිඳීම කරන අතර ම, බරපතළ තුවාල සිදු කිරීම |